# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 89 — 1973 දෙසැම්බර් 07 වැනි සිකුරාද — 1973.12.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 1271 | ආදායම හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | 1277 |
| තනතුරු–ඇබෑර්තු ... ... ... | 1273 | අය–වැය ලේඛන ... ... ... | 1281 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... .. ... | 1276 | දේපල විකිණීම ... .. ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 1276 | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 1285 |


**සැළකිය යුතුයි.**—පොලිස් සංශෝධන පනත් කෙටුම්පත 1973 නොවැම්බර් 30 දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩාගල්බොඩ ගම් ප්‍රදේශය තුළ ඒ වගන්තිය යටතේ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම්සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

පීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ ඇමති.

1973 නොවැම්බර් 20 දින, කොළඹ දී ය.

12–20—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, පුත්තලම දිස්ත්‍රික්කයේ උඩප්පු ගම්සභාවට, ඒ ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් එකී වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

පීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1973 ඔක්තෝබර් මස 24 දින,
කොළඹ දී ය.

12–90—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1973 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## පැලියගොඩ නගර සභාව

### විනෝද බදු ආඥපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පැලියගොඩ නගර සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව, ඒ වගන්තියේ (2) උප වගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

### යෝජනාව

" (267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මෙම සභාව විසින්, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥපනතෙහි විස්තර කොට ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන ගාස්තු වලින්, 1965 ජුලි 23 වැනි දින අංක 14,458 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මුතියෙන් එබඳු ගෙවීම් සඳහා පනවා අය කරනු ලබන බද්ද වෙනුවට මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව වූ බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළවන දින සිට, මෙයින් පනවා අය කරනු ලැබේ.

| ගෙවන මුදල බදු ප්‍රමාණ හැර ඇතුළුවීමේ ගාස්තුව | බදු ප්‍රමාණය රු. | ශ. |
|---|---|---|
| (1) ශත 25ට අඩු නොවන නමුත් ශත 60ට වැඩි නොවන විට | 0 | 05 |
| (2) ශත 60ට වැඩිවන නමුත් රු. 1.00ට වැඩි නොවන විට ... | 0 | 15 |
| (3) රු. 1.00ට වැඩිවන නමුත් රු. 1.50ට වැඩි නොවන විට... | 0 | 20 |
| (4) රු. 1.50ට වැඩිවන නමුත් රු. 2.00ට වැඩි නොවන විට... | 0 | 25 |
| (5) රු. 2.00ට වැඩිවන නමුත් රු. 2.50ට වැඩි නොවන විට... | 0 | 35 |
| (6) රු. 2.50ට වැඩිවන නමුත් රු. 3.00ට වැඩි නොවන විට... | 0 | 50 |
| (7) රු. 3.00ට වැඩිවන නමුත් රු. 3.50ට වැඩි නොවන විට... | 0 | 60 |
| (8) රු. 3.50ට වැඩිවන නමුත් රු. 4.00ට වැඩි නොවන විට... | 0 | 70 |
| (9) රු. 4.00ට වැඩිවන නමුත් රු. 4.50ට වැඩි නොවන විට... | 0 | 85 |
| (10) රු. 4.50ට වැඩිවන නමුත් රු. 5.00ට වැඩි නොවන විට... | 1 | 0 |
| (11) රු. 5.00ට වැඩිවන විට ගෙවන මුදලින් සියයට විසිපහකි. | | |

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 නොවැම්බර් මස 7 වැනි දින,
කොළඹ දී ය.

12–91—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## රඹුක්කන නගරය

### විනෝද බදු ආඥපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, රඹුක්කන නගරය සඳහා වූ විශේෂ කොමසාරිස් විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරනු ලැබ, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව, එකී වගන්තියේ 2 වැනි උප වගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

### යෝජනාව

" (267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, රඹුක්කන නගරය සඳහා වූ විශේෂ කොමසාරිස්වරයා විසින් එම නගරයේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයේ පැවැත්වෙන (එම ආඥපනතෙහි අර්ථ නිරූපනය කරන ලද පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අය කෙරෙන සියළුම ගෙවීම් වලින් 1947 දෙසැම්බර් 23 වැනි දින අංක 9,811 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මුතියෙන් එබඳු ගෙවීම් සඳහා පනවා අය කරන ලද බද්ද වෙනුවට මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව වූ බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළ වන දින සිට මෙයින් පනවා අය කරනු ලැබේ.

| ගෙවන මුදල බදු ප්‍රමාණය හැර ඇතුළුවීමේ ගාස්තුව | බදු ප්‍රමාණය රු. | ශ. |
|---|---|---|
| (1) ශත 20ට නොඅඩු නමුත් ශත 39ව වැඩි නොවන විට | 0 | 05 |
| (2) ශත 39ට වැඩිවන නමුත් ශත 59ට වැඩි නොවන විට | 0 | 10 |
| (3) ශත 59ට වැඩිවන නමුත් ශත 79ට වැඩි නොවන විට | 0 | 15 |
| (4) ශත 79ට වැඩිවන නමුත් ශත 99ට වැඩි නොවන විට | 0 | 20 |
| (5) ශත 99ට වැඩිවන නමුත් රු. 1.19ට වැඩි නොවන විට | 0 | 25 |
| (6) රු. 1.19ට වැඩිවන නමුත් රු. 1.39ට වැඩි නොවන විට | 0 | 30 |
| (7) රු. 1.39ට වැඩිවන නමුත් රු. 1.59ට වැඩි නොවන විට | 0 | 35 |
| (8) රු. 1.59ට වැඩිවන නමුත් රු. 179ට වැඩි නොවන විට | 0 | 40 |
| (9) රු. 1.79ට වැඩිවන නමුත් රු. 1.99ට වැඩි නොවන විට | 0 | 45 |
| (10) රු. 1.99ට වැඩිවන නමුත් රු. 2.19ට වැඩි නොවන විට | 0 | 50 |
| (11) රු. 2.19ට වැඩිවන නමුත් රු. 2.39ට වැඩි නොවන විට | 0 | 55 |
| (12) රු. 2.39ට වැඩිවන නමුත් රු. 2.59ට වැඩි නොවන විට | 0 | 60 |
| (13) රු. 2.59ට වැඩිවන නමුත් රු. 2.79ට වැඩි නොවන විට | 0 | 65 |
| (14) රු. 2.79ට වැඩිවන නමුත් රු. 2.99ට වැඩි නොවන විට | 0 | 70 |
| (15) රු. 2.99ට වැඩිවන නමුත් රු. 3.19ට වැඩි නොවන විට | 0 | 75 |
| (16) රු. 3.19ට වැඩිවන නමුත් රු. 3.39ට වැඩි නොවන විට | 0 | 80 |
| (17) රු. 3.39ට වැඩිවන නමුත් රු. 3.59ට වැඩි නොවන විට | 0 | 85 |
| (18) රු. 3.59ට වැඩිවන නමුත් රු. 3.79ට වැඩි නොවන විට | 0 | 90 |
| (19) රු. 3.79ට වැඩිවන නමුත් රු. 3.99ට වැඩි නොවන විට | 0 | 95 |
| (20) රු. 3.99ට වැඩිවන නමුත් රු. 4.19ට වැඩි නොවන විට | 1 | 0 |
| (21) රු. 4.19ට වැඩිවන විට ගෙවන මුදලින් සියයට විසිපහකි. " | | |

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

12–89—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### (265 වැනි අධිකාරය වන) පළාත් පාලන (පාලන ප්‍රදේශ) ආඥපනත

පහත දැක්වෙන පත්වීම කර ඇති බැව් මෙයින් නිවේදනය කෙරේ :—

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පංතියේ ආර්. ත්‍යාගලිංගම් මහතා, 1973 නොවැම්බර් මස 15 වැනි දින සිට, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ ඩී. ඩැන්පෝර්ක් මහතා නැවත රාජකාරි භාරගන්නා තුරු, වවුනියා ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්,

1973 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

12–251—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වූනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය**

**පළාත් පාලන සේවය**

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේව කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදලවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

**————————තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳැහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—

අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :—.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ලංකාවේ නුපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5 | | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ) —

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ. පො. ස (උසස් පෙළ):—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් :—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————;

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වැනි ශ්‍රේණියේ නිළධාරීන්ගේ කා.කා. පරීක්ෂණය—1972.09.16**

1973.03.30 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පලකර ඇති ඉහත සඳහන් විභාග ප්‍රතිඵලවල විභාග අංක 115 සහ 153 පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ :—

| විභාග අංකය | නම | ප්‍රා. බ. ම. | සමත් විෂයයන් |
|---|---|---|---|
| 115 | පී. වී. සිරිසේන* | කොට්කාවත්ත ප.ආ. ස. | 1. ගිණුම. 2. නීති. |
| 153 | එච්. එම්. ජේ. සමාන්* | පුත්තලම ප. ආ. ස. | 1. ගිණුම |

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 නොවැම්බර් මස 22 දින,
තැ. පෙ. 530, කොළඹ.

12–7—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී. 18/65.

**මාවනැල්ල නගරය**

**සුළු නගර සභා ආඥපනත**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ මාවනැල්ල නගරයේ විශේෂ කොමසාරිස්වරයා විසින් සාදනු ලැබ ඒ ආඥපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවැරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 නොවැම්බර් 7 වැනි දින,
කොළඹ දී ය.

**අතුරු ව්‍යවස්ථාව**

**පොදු වෙළෙඳ පොල**

සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ XV වන කොටසේ 1 වන අතුරු ව්‍යවස්ථාවේ කාර්‍යයන් සඳහා ''වෙළඳ පොල ප්‍රදේශය'' යනු පොදු වෙළඳපොල මැද සිට සැතපුම් කාලක අර්ධ විෂ්කම්භය ඇතුළත පිහිටි ප්‍රදේශය විය යුතුය.

12–213 –73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**බදුල්ල මහ නගර සභාව**

**අවලංගුකිරීමේ දැන්වීම**

1973 පෙබරවාරි 2 වැනි දින හා අංක 45 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ බදුල්ල මහ නගර සභාවේ ජල කර්මාන්ත සම්බන්ධයෙන් පළවූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කෙරේ.

12–210—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී.9/65.

**කැළණිය සුළු නගර සභාව**

**සුළු නගර සභා ආඥපනත**

(256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 වෙනි සහ 156 වෙනි වගන්ති යටතේ කැළණිය සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥපනතේ 153 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 නොවැම්බර් 19 වෙනි දින,
කොළඹ දීය.

**අතුරු ව්‍යවස්ථා**

**තාවකාලික ගොඩනැගිලි**

1. සභාපති විසින් හෝ ඔහු වෙනුවෙන් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය ඇතිව මිස, සභාවේ පාලන සීමා තුළ ප්‍රසිද්ධ පාරක කිසිදු තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ ඉදි කරවීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

2. පළමුවන අතුරු ව්‍යවස්ථාව යටතේ එවැනි අවසර පත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන සෑම තැනැත්තකු විසින්ම සභාපති වෙත ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර, එවැනි, ඉල්ලුම් පත්‍රයක—

(1) යෝජිත තාවකාලික ගොඩනැගිල්ල ඉදි කිරීමට නියමිත ස්ථානය;

(2) එම ගොඩනැගිල්ලේ ස්වාභාවය හා මිම් ගණන්; සහ

(3) අවසර පත්‍රය ලබාගත යුත්තේ කොපමණ කාල සීමාවක් සඳහාද යන වග සඳහන් කළ යුතුය.

3. (1) අවට ප්‍රදේශයේ සැප පහසුකම්වලට හානියක් වන පරිදි යෝජිත ගොඩනැගිල්ල ඉදි කෙරෙන භූමිය ප්‍රමුඛ ස්ථානයක පිහිටා තිබෙ නම්; හෝ

(2) එම භූමිය බස්රථ, තිරික්කල, කරත්ත හෝ කුළී මෝටර් රථ සඳහා ප්‍රසිද්ධ නැවතුම් පලක් ලෙස දැනුත් භාවිත වේ නම්; හෝ

(3) එකී යෝජිත ගොඩනැගිල්ලෙන් ගැනීමට අදහස් කරනු ලබන ප්‍රයෝජනය හේතුකොට ගෙන කවර අන්දමේ වුවද හිරිහැරයක් ඇති වියහැකි නම්; හෝ

(4) එම තාවකාලික ගොඩනැගිල්ල අවසර නොලත් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා යෙදවීමට අදහස් කර ඇත් නම්; හෝ

(5) භූමිය අයිතිකරුගෙන් ඒ සඳහා අවසරය ලබාගෙන නැත්නම්; හෝ

(6) එම ගොඩනැගිල්ලෙන් යම් ප්‍රසිද්ධ පාරකට යම් අවහිරයක් හෝ ප්‍රසිද්ධ පාරකට අයිති බිම අයුතු ලෙස අල්ලා ගැනීමක් සිදුවිය හැකි නම්, පළමුවන අතුරු ව්‍යවස්ථාව යටතේ යම් තාවකාලික ගොඩනැගිල්ලක් තැනීම සඳහා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

4. පළමුවෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් සඳහාම මෙහි උපලේඛනයෙහි සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් ගෙවිය යුතුය. පුණ්‍ය කටයුතු සඳහා ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි සම්බන්ධයෙන් ඒ ගාස්තුව නොගෙවිය යුතුය.

5. පළමුවෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් තාවකාලික ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් අවසර පත්‍රය නිකුත් කරන සභාපති හෝ නිළධරයා විසින්, එම තාවකාලික ගොඩනැගිල්ල තබා ගත හැක්කේ කුමන කාල සීමාවක් තුළ ද යන වග එම අවසර පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

6. පළමුවෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් පිට තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කරන හෝ ඉදි කරවන සෑම තැනැත්තකු විසින්ම ඒ අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කාල සීමාව අවසානයේදී ඒ තාවකාලික ගොඩනැගිල්ල කඩා දැමිය යුතුය. නැතහොත් එසේ කරවිය යුතුය.

7. පළමුවෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයකම, ඒ අවසර පත්‍රය නිකුත් කළ යුත්තේ නිකම් කොන්දේසි වලට යටත්වද යන වග සභාපති විසින් නිශ්චිතව සඳහන් කළ හැකිය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවන්ගෙන් කිසිවක් හෝ පළමුවෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කොන්දේසි වලින් කිසිවක් හෝ කඩ කරන සෑම අවස්ථාවකදීම රු. 50 කට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු අතර, එවැනි කඩ කිරීමක් දිගින් දිගටම කරගෙන යන අවස්ථාවකදී නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ දින සිට දිනකට රු. 25 කට වැඩි නොවන අතිරේක දඩයක් නියම කිරීමෙන් දඬුවම් කළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි—

''ආඥපනත'' යනුවෙන් (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනත අදහස් වේ;

''සභාපති'' යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ;

''සභාව'' යන්නෙන් කැළණිය සුළු නගර සභාව අදහස් වේ;

''තාවකාලික ගොඩනැගිල්ල'' යන්නට තැනින් තැන ගෙන යා හැකි වේදිකාවක්, ඉවත්කළ හැකි රාක්කයක්, වහලයක් සවිකරන ලද වේදිකාවක්, බිම සවිකරන ලද තාවකාලික හෝ ස්ථාවර මුක්කු පිට සාදන ලද වහලයක් හෝ රෝද පිට නවතා තිබෙන ඕනෑම ඉදි කිරීමක් ඇතුළත් වේ; තවද

''ප්‍රසිද්ධ පාර'' යන්නට ඒ ආඥපනතෙහි දී ඇති අර්ථයම ඇත

**උපලේඛනය**

**අවසර පත්‍රය නිකුත් කළ කාළසීමාව**

| | | | රු. ශ. |
|---|---|---|---|
| (අ) මසකට වැඩි නොවේ නම් | ... | ... | 2 50 |
| (ආ) මසකට වැඩි නම් හෝ වැඩිවන සෑම මසකටම හෝ ඉන් කොටසකට | ... | ... | 2 50 |

12–238—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

**හික්කඩුව සුළු නගර සභාව**

**1972 වර්ෂයේ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශය**

**ආදායම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... | | 78,281 95 |
| බී.—මහා මාර්ග ... ... | | 1,491 54 |
| සී.—සභාව සතු ඉඩම් සහ ගොඩනැගිලි ... | | 2,246 34 |
| ඩී.—ජන සෞඛ්‍ය ... ... | | 12,151 50 |
| ඊ.—විනෝද කටයුතු ... ... | | 840 15 |
| ජී.—සුනඛයින් ලේඛනගත කිරීම ... | | 3 0 |
| **වෙනත් ආදායම් :** | | |
| 1. තැන්පත් ගිණුම— | | |
| රජයේ ආධාර ... ... | — | |
| පුස්තකාල ගොඩනැගිලි අරමුදල... | 10,000 0 | |
| සාමාන්‍ය තැන්පත් ... | 16,747 87 | |
| | | 26,747 87 |
| 2. අත්තිකාරම් සහ ආයෝජන ගිණුම... | | 12,593 09 |
| 3. ණය ගිණුම ... ... | | 11,000 0 |
| 4. විවිධ ණය ගැති ගිණුම ... | | 31,647 28 |
| 5. විවිධ ණය හිමි ගිණුම ... | | 11,147 93 |
| 6. විදුලිය ගිණුම ... ... | | 1,11,301 57 |
| 7. අධිකය හා ඌනතා ගිණුම (සාමාන්‍ය) | | 6,248 22 |
| 8. අධිකය හා ඌනතා ගිණුම (විදුලිය) | | 1,671 75 |
| 9. ස්ථිර තැන්පත් ගිණුම ... | | 10,000 0 |
| 10. විදුලිය ක්ෂය සංචිත අරමුදල් ගිණුම : | | 1,000 0 |
| 11. ආදායම් එකතු කිරීමේ ගිණුම : | | |
| වරිපණම් බදු ... ... | 17,741 23 | |
| වැසිකිළි ගාස්තු ... | 288 0 | |
| බදු සහ කුලී ... ... | 1,577 70 | |
| වරෙන්තු ගාස්තු ... | 413 11 | |
| විදුලිය ගාස්තු ... ... | 80,651 60 | |
| | | 1,00,671 64 |
| 1972.1.1 මුදල් ශේෂය | | 62,626 80 |
| එකතුව ... | | 4,81,670 63 |

**වියදම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | | 34,795 80 |
| බී.—මහා මාර්ග ... ... | | 10,830 77 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | | 10,108 41 |
| ඩී.—ජන සෞඛ්‍ය ... ... | | 44,129 78 |
| ඊ.—විනෝද කටයුතු ... ... | | 30 0 |
| ජී.—සුනඛයින් ලේඛනගත කිරීම ... | | — |
| **වෙනත් වියදම් :** | | |
| 1. තැන්පත් ගිණුම— | | |
| රජයේ ආධාර ... ... | 39,308 97 | |
| පුස්තකාල ගොඩනැගිලි අරමුදල ... | 4,714 59 | |
| සාමාන්‍ය තැන්පත් ... | 18,737 37 | |
| | | 62,760 93 |
| 2. අත්තිකාරම් සහ ආයෝජන ගිණුම ... | | 11,798 21 |
| 3. ණය ගිණුම ... ... | | 11,123 38 |
| 4. විවිධ ණය ගැති ගිණුම ... | | 42,061 23 |
| 5. විවිධ ණය හිමි ගිණුම ... | | 32,495 11 |
| 6. විදුලිය ගිණුම ... ... | | 78,330 89 |
| 7. අධිකය හා ඌනතා ගිණුම (සාමාන්‍ය) | | 11,859 70 |
| 8. අධිකය හා ඌනතා ගිණුම (විදුලිය) ... | | 0 03 |
| 9. ස්ථිර තැන්පත් ගිණුම ... | | 3,232 50 |
| 10. ආදායම් එකතු කිරීම් ගිණුම : | | |
| වරිපනම් බදු ... ... | 20,158 59 | |
| වැසිකිළි ගාස්තු ... | 168 0 | |
| බදු සහ කුලී ... ... | 1,716 40 | |
| වරෙන්තු ගාස්තු ... | 215 38 | |
| විදුලිය ගාස්තු ... ... | 84,631 80 | |
| | | 1,06,890 17 |
| 1972.12.31 මුදල් පොතේ ඉතිරි : | | |
| සාමාන්‍ය ... ... | 15,059 69 | |
| විදුලිය ... ... | 7,164 03 | |
| | | 21,223 72 |
| එකතුව ... | | 4,81,670 63 |

හික්කඩුව සුළු නගර සභාවේ සභාපති, සෙම්බ කුට්ටි නන්දිසේන වන මම මගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට 1972 වර්ෂය සඳහා ඉහතින් දක්වා ඇති හික්කඩුව සුළු නගර සභාවේ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශය සැබෑ හා නිවැරදි වූවක් බැව් මෙයින් සහතික කර ප්‍රකාශ කරමි.

ඇස්. කේ. නන්දිසේන,
හික්කඩුව සුළු නගර සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

සාමවිනිසුරු එච්. වී. එල්. ඩී. ගුණසිංහ,
හික්කඩුව සුළු නගර සභාවේ අංක 5
කොට්ඨාශයේ නියෝජිත සහ උප සභාපති.

1973 මැයි 30 වැනි දින හික්කඩුවේදී මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

කේ. එච්. ඩබ්ලිව්. ඕ. ද සිල්වා,
සාම විනිසුරු.

## හික්කඩුව සුළු නගර සභාව

### 1972.12.31 වැනි දිනට වත්කම් සහ බැරකම් ප්‍රකාශය

**බැරකම්**

| කැන්පත් | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| සාමාන්‍ය ... ... | | 29,385 97 | | | |
| රජයේ ආධාර : | | | | | |
| ක්‍රීඩා භූමි ... | 351 25 | | | | |
| ධීවර නිවාස ... | 61 83 | | | | |
| පැති කාණු ... | 366 73 | | | | |
| ප්‍රජා මණ්ඩල ... | 110 0 | | | | |
| ධීවර මංමාවත් ... | 6,220 0 | | | | |
| | | 7,109 81 | | | |
| පුස්තකාල ගොඩනැගිල්ල | | 5,285 41 | | | |
| | | | | | 41,781 19 |
| විදුලිය ක්ෂය සංචිතය අරමුදල් ... | | | | | 17,000 0 |
| විවිධ ණය හිමියෝ ... | | | | | 11,723 43 |
| අධිකය හා ඌනතා ගිණුම (සාමාන්‍ය) : | | | | | |
| 1972.01.01.දිනට අධිකය ... | | | 12,156 75 | | |
| 1972 වර්ෂයේ ආදායම ... | | 95,014 48 | | | |
| 1972 වර්ෂයේ සකස් කිරීම් බැර ... | | 6,248 22 | | | |
| | | | 1,01,262 70 | | |
| | | | | 1,13,419 45 | |
| 1972 වර්ෂයේ වියදම ... | | 99,894 76 | | | |
| 1972 වර්ෂයේ සකස් කිරීම් හර ... | | 11,859 70 | | | |
| | | | | 1,11,754 46 | |
| | | | | | 1,664 99 |
| අධිකතා ඌනතා ගිණුම (විදුලිය) | | | | | |
| 1972.01.01 දිනට අධිකය ... | | | 90,089 98 | | |
| 1972 වර්ෂයේ ආදායම ... | | 1,11,301 57 | | | |
| 1972 වර්ෂයේ සකස් කිරීම් බැර ... | | 1,671 75 | | | |
| | | | 1,12,973 32 | | |
| | | | | 2,03,063 30 | |
| 1972 වර්ෂයේ වියදම ... | | 78,330 89 | | | |
| 1972 වර්ෂයේ සකස් කිරීම හර ... | | 0 03 | | | |
| | | | | 78,330 92 | |
| | | | | | 1,24,732 38 |
| | | | | එකතුව ... | 1,96,901 99 |

**වත්කම්**

| | රු. ශ. |
|---|---|
| අත්තිකාරම් ... ... | 1,124 62 |
| වරිපණම් බදු ... ... | 7,112 58 |
| වරෙන්තු ගාස්තු ... | 97 89 |
| වැසිකිළි ගාස්තු ... ... | 32 0 |
| කුලී සහ බදු ... ... | 1,228 54 |
| විදුලි ගාස්තු ... ... | 21,577 91 |
| විවිධ ණය ගැතියෝ ... | 44,524 73 |
| ස්ථිර තැන්පත් ... ... | 99,980 0 |
| 1972.12.31 දිනට ඉතිරි මුදල් ... | 21,223 72 |
| එකතුව ... | 1,96,901 99 |

හික්කඩුව සුළු නගර සභාවේ සභාපති, සෙම්බකුට්ටි නන්දසේන වන මම, මගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට, 1972 වර්ෂය සඳහා ඉහතින් දක්වා ඇති හික්කඩුව සුළු නගර සභාවේ වත්කම් සහ බැරකම් ප්‍රකාශය සැබෑ හා නිවැරදි වූවක් බැව් මෙයින් සහතික කර ප්‍රකාශ කරමි.

ඇස්. කේ. නන්දසේන,
හික්කඩුව සුළු නගර සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

සාම විනිසුරු එච්. වී. එල්. ඩී. ගුණසිංහ,
හික්කඩුව සුළු නගර සභාවේ අංක 5
කොට්ඨාශයේ නියෝජිත සහ උප සභාපති.

1973 මැයි 30 වැනි දින හික්කඩුවේදී මා ඉදිරිපිටදී සහතික කරන ලදි.
කේ. එච්. ඩබ්ලිව්. ඔ. ද සිල්වා,
සාම විනිසුරු.

12–73—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## මාදම්පේ සුළු නගර සභාව

### 1970 වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය

| ආදායම | රු. ශ. | වියදම | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... ... | 90,294 66 | ඒ.—සාමාන්‍ය වියදම ... ... ... | 31,699 28 |
| බී.—මංමාවත් ... ... ... | 2,362 81 | බී.—මංමාවත් ... ... ... | 26,989 19 |
| සී.—නගර සභා ගොඩනැගිලි හා ඉඩම් ... ... | 8,995 60 | සී.—නගර සභා ගොඩනැගිලි හා ඉඩම් ... ... | 8,990 98 |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... ... | 19,300 18 | ඩී.—මහජන සෞඛ්‍යය ... ... ... | 58,883 24 |
| ඊ.—මහජන විනෝදය ... ... ... | 5,875 0 | ඊ.—මහජන විනෝදය ... ... ... | 686 0 |
| එෆ්.—සුසාන භූමි ... ... ... | 527 50 | එෆ්.—සුසාන භූමි ... ... ... | 1,718 49 |
| ජී.—බල්ලන් ලියාපදිංචි කිරීම ... ... | 16 50 | ජී.—බල්ලන් ලියාපදිංචි කිරීම ... ... | 20 25 |
| මුළු ආදායම ... | 1,27,372 25 | මුළු වියදම ... | 1,28,987 43 |

| වෙනත් ලැබීම් | රු. ශ. | වෙනත් ගෙවීම් | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් ... ... ... | 27,004 13 | තැන්පත් ... ... ... | 23,069 68 |
| අත්තිකාරම් ... ... ... | 37,148 67 | අත්තිකාරම් ... ... ... | 11,172 11 |
| විදුලිය පිළිබඳ ගණුදෙනු ... ... | 1,17,252 97 | විදුලිය පිළිබඳ ගණුදෙනු ... ... | 1,15,977 13 |
| ක්ෂය සංචිතය ... ... ... | 2,000 0 | ක්ෂය සංචිතය ... ... ... | — |
| විවිධ ණය ගැතියෝ ... ... ... | 23,018 49 | විවිධ ණය ගැතියෝ ... ... ... | 18,588 98 |
| විවිධ ණය හිමියෝ ... ... ... | 36,818 79 | විවිධ ණය හිමියෝ ... ... ... | 28,275 12 |
| අධිකතා හා ඌණතා ගිණුම ... ... | 751 01 | අධිකතා හා ඌණතා ගිණුම ... ... | 1,213 34 |

| ආදායම් එකතු කිරීමේ ගිණුම | රු. ශ. | ආදායම් එකතු කිරීමේ ගිණුම | රු. ශ. |
|---|---|---|---|
| දේපල බදු ... ... ... | 11,824 49 | දේපල බදු ... ... ... | 17,907 44 |
| වැසිකිළි බදු ... ... ... | 5,913 53 | වැසිකිළි බදු ... ... ... | 8,968 94 |
| විදුලි ගාස්තු ... ... ... | 1,03,222 05 | විදුලි ගාස්තු ... ... ... | 1,00,233 18 |
| කුළී ... ... ... ... | 16,850 20 | කුළී ... ... ... ... | 16,311 20 |
| වරෙන්තු ගාස්තු ... ... ... | 117 75 | වරෙන්තු ගාස්තු ... ... ... | 502 30 |
| | 5,09,294 33 | | 4,72,206 85 |
| 1969 දෙසැම්බර් 31 වැනි දිනට ඉතිරි මුදල් ... | 10,431 66 | 1970 දෙසැම්බර් 31 වැනි දිනට ඉතිරි මුදල් ... | 48,519 14 |
| | 5,19,725 99 | | 5,19,725 99 |

මාදම්පේ සුළු නගර සභාවේ සභාපති, සේගුපති සේගු ඉබ්රාහිම් වන මම, ඉහත සඳහන් 1970 වර්ෂයේ ආදායම් හා වියදම් ප්‍රකාශය මගේ උසස් ම දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

සේගුපති සේගු ඉබ්රාහිම්,
සභාපති,
මාදම්පේ සුළු නගර සභාව.

1971 නොවැම්බර් මස 4 වැනි දින,
මාදම්පේ, සුළු නගර සභා කාය්‍යාලයේ දී ය.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.
වාල්ස් විජේසිංහ,
අංක 3 කොට්ඨාශයේ නියෝජිත තැන.

1971 නොවැම්බර් මස 4 වැනි දින මාදම්පේදී මා ඉදිරිපිටදී සහතික කරන ලදී.
කේ. ඩබ්ලිව්. ද ඇස්. විජේසිංහ,
සාමදාන විනිශ්චයකාර තැන.

මාදම්පේ සුළු නගර සභාව

1970 දෙසැම්බර් 31 වැනි දිනට දක්වෙන වත්කම් හා බැරකම් ප්‍රකාශය

| බැරකම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත්—සාමාන්‍ය ... | | 28,202 14 | |
| වැය නොකල රජයේ ආධාර.— | | | |
| විද්‍යාල මාවත ... | 1,856 10 | | |
| සා. සෙබස්තියන් මාවත | 3,090 98 | | |
| ක්‍රීඩා භූමි ... | 5,085 0 | | |
| පුස්තකාල ... | 1,361 95 | | |
| පැතිකාණු ... | 23,181 06 | | |
| | | 34,575 09 | |
| | | | 62,777 23 |
| විවිධ ණය හිමියෝ ... | | | 2,22,674 09 |
| ක්ෂය සංචිතය ... | | | 6,000 0 |
| | | | 2,91,451 32 |

| වත්කම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... | | | 41,548 94 |
| දේපල බදු—හිඟ ... | | | 41,074 61 |
| වැසිකිළි බදු හිඟ ... | | | 20,570 15 |
| කුළී හිඟ ... ... | | | 7,038 98 |
| විදුලි ගාස්තු ... | | | 29,774 26 |
| විවිධ ණය ගැතියෝ ... | | | 34,986 36 |
| වරෙන්තු ගාස්තු—හිඟ ... | | | 2,210 06 |
| අධිකතා හා ඌණතා ගිණුම (සාමාන්‍ය).— | | | |
| 1970.1.1 දිනට ඌණතාවය | | 47,587 76 | |
| 1970 වර්ෂයේ සැකසීම් (බැර) ... ... | | 743 21 | |
| | | 46,844 55 | |
| 1970 වර්ෂයේ වියදම ... | 1,28,987 43 | | |
| 1970 වර්ෂයේ ආදායම ... | 1,27,372 25 | | |
| | | 1,615 18 | |
| | | 48,459 73 | |
| 1970 වර්ෂයේ සැකසීම් (හර) ... | | 1,208 34 | |
| | | | 49,668 07 |
| අධිකතා හා ඌණතා ගිණුම (විදුලි අංශය) : | | | |
| 1970.1.1 දිනට ඌණතාවය | | 17,339 39 | |
| 1970 වර්ෂයේ සැකසීම් (හර) ... | | 5 0 | |
| | | 17,344 39 | |
| 1970 වර්ෂයේ ආදායම ... | 1,17,252 97 | | |
| 1970 වර්ෂයේ වියදම ... | 1,15,977 13 | | |
| | | 1,275 84 | |
| | | 16,068 55 | |
| 1970 වර්ෂයේ සැකසීම් (බැර) ... | | 7 80 | |
| | | | 16,060 75 |
| 1970.12.31 වැනි දිනට ඉතිරි මුදල් ... | | | 48,519 14 |
| | | | 2,91,451 32 |

මාදම්පේ සුළු නගර සභාවේ සභාපති, සේගුපති සේගු ඉබ්රාහිම් වන මම, ඉහත සඳහන් 1970 දෙසැම්බර් 31 වැනි දිනට දක්වෙන මාදම්පේ සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් ප්‍රකාශය මගේ උසස්ම දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

සේගුපති සේගු ඉබ්රාහිම්,
සභාපති,
මාදම්පේ සුළු නගර සභාව.

1971 නොවැම්බර් මස 4 වැනි දින,
මාදම්පේ සුළු නගර සභා කාය්‍යාලයේ දී ය.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.
වාල්ස් විජේසිංහ,
අංක 3 කොට්ඨාශයේ නියෝජිත තැන.

1971 නොවැම්බර් මස 4 වැනි දින මාදම්පේ දී මා ඉදිරිපිටදී සහතික කරන ලදී.
කේ. ඩබ්ලිව්. ද ඇස්. විජේසිංහ,
සාමදාන විනිශ්චයකාර තැන.

12–234—73,12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

### බලන්ගොඩ නගරය

1971.12.31 දිනට වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

| බැරකම් | රු. ශ. |
|---|---|
| තැන්පත් ... ... | 1,41,948 59 |
| රජයේ ආධාර—පුස්තකාල ... | 232 25 |
| රජයේ ආධාර—ප්‍රජාමණ්ඩල ... | 390 0 |
| රජයේ ආධාර—සාහිත්‍ය දිනය ... | 8 0 |
| රජයේ ආධාර—නිවාස යෝජනා ක්‍රම I ... | 1,743 81 |
| රජයේ ආධාර—නිවාස යෝජනා ක්‍රය II ... | 913 50 |
| රජයේ ආධාර—තානායම... ... | 18,750 0 |
| ණය මුදල්—නිවාස යෝජනා ක්‍රම I ... | 129 11 |
| ණය මුදල්—විදුලිය මග දිගු කිරීම ... | 6,154 25 |
| ණය මුදල්—ජල සම්පාදන ටැංකි ... | 24,500 0 |
| විදුලිය දෙපාර්තමේන්තුවේ ක්ෂය සංචිතය ... | 20,356 97 |
| එකතුව ... | 2,15,126 48 |

| වත්කම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... ... | | | 10,541 05 |
| ස්ථිර තැන්පත්—මහජන බැංකුව ... | | | 15,000 0 |
| ජල සම්පාදන අධ්‍යක්ෂ—ජල සම්පාදන කටයුතු සඳහා අත්තිකාරම් ... ... | | | 24,500 0 |
| මුදල් ශේෂය—මහජන බැංකුව, බලන්ගොඩ... | 15,186 18 | | |
| අත ඉතිරි මුදල් ... | 7,447 09 | | |
| අත් මුදල ... ... | 100 0 | | |
| | | | 22,733 27 |
| ඌණතාවය 1970.12.31 දිනට ... | | 1,53,932 66 | |
| 1971 වර්ෂයේ ආදායම ... ... | 4,61,259 78 | | |
| 1971 වර්ෂයේ වියදම ... ... | 4,49,679 28 | | |
| 1971 වර්ෂයේ අතිරික්තය ... ... | | 11,580 50 | |
| 1971.12.31 දිනට ඒකරාශිවූ ඌණතාවය ... | | | 1,42,352 16 |
| එකතුව | | | 2,15,126 48 |

බලන්ගොඩ නගරයේ විශේෂ කොමසාරිස් වූ ජී. දයානන්ද ද සිල්වා වන මම, ඉහත සඳහන් ප්‍රකාශනය මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1971 දෙසැම්බර් මස 31 දිනට බලන්ගොඩ නගරයේ වත්කම් හා බැරකම් පිළිබඳ නිවැරැදිවූත්, සත්‍යවූත්, ප්‍රකාශණයක් බවට මෙයින් සහතික කරමි.

ජී. දයානන්ද ද සිල්වා,
විශේෂ කොමසාරිස්, බලන්ගොඩ නගරය.

1972 මැයි මස 8 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.
කේ. ඩී. කරුණාරත්න,
සාමදාන විනිශ්චයකාර හා බඹරබොටුව ගම් සභාපති.

### බලන්ගොඩ නගරය

1971.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම හා වියදම දක්වෙන ප්‍රකාශනය

| ආදායම | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... | 1,94,592 08 | |
| බී.—මහා මාර්ග ... ... | 891 20 | |
| සී.—තානායම්පොල ... ... | 1,090 65 | |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 5,947 0 | |
| ඊ.—මහජන සනීපාරක්ෂාව ... | 62,870 48 | |
| ඇෆ්.—මහජන විනෝදය... ... | 20,827 40 | |
| ජී.—සොහොන් බිම් ... ... | 340 0 | |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... | 19 50 | |
| ජේ.—විදුලිබල දෙපාර්තමේන්තුව ... | 1,73,382 36 | |
| ඇම්.—කියවීම්ශාලා හා පුස්තකාල ... | 1,299 11 | |
| | | 4,61,259 78 |
| **වෙනත් ආදායම්** | **රු. ශ.** | **රු. ශ.** |
| තැන්පත් ... ... | 38,869 44 | |
| අත්තිකාරම් ... ... | 61,003 40 | |
| විදුලිය අංශයේ ක්ෂය සංචිතය ... | 2,000 0 | |
| ණය මුදල්—විදුලිය මග දිගු කිරීම ... | 15,180 0 | |
| රජයේ ආධාර—ප්‍රජාමණ්ඩල ... | 150 0 | |
| රජයේ ආධාර—නිවාස යෝජනා ක්‍රම IV අදියර | 6,000 0 | |
| 1970.12.31 දිනට ඉතිරි ... | 13,499 48 | |
| | | 1,36,702 32 |
| | | 5,97,962 10 |

| වියදම | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | 77,832 23 | |
| බී.—මහා මාර්ග ... ... | 31,487 28 | |
| සී.—තානායම්පොල ... ... | 5,838 29 | |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 24,379 46 | |
| ඊ.—මහජන සනීපාරක්ෂාව ... | 1,38,093 32 | |
| ඇෆ්.—මහජන විනෝදය ... ... | 4,078 37 | |
| ජී.—සොහොන් බිම් ... ... | 1,979 70 | |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... | 15 0 | |
| ජේ.—විදුලි බල දෙපාර්තමේන්තුව ... | 1,57,256 51 | |
| ඇම්.—කියවීම්ශාලා හා පුස්තකාල ... | 8,719 12 | |
| | | 4,49,679 28 |
| **වෙනත් වියදම්** | **රු. ශ.** | **රු. ශ.** |
| තැන්පත් ... ... ... | 36,855 68 | |
| අත්තිකාරම් ... ... | 60,867 83 | |
| රජයේ ආධාර—නිවාස යෝජනා ක්‍රම IV අදියර | 7,886 96 | |
| රජයේ ආධාර—පුස්තකාල ... ... | 526 48 | |
| ණය මුදල්—විදුලිය මග දිගු කිරීම ... | 19,412 60 | |
| 1971.12.31 දිනට ඉතිරි ... | 22,733 27 | |
| | | 1,48,282 82 |
| | | 5,97,962 10 |

බලන්ගොඩ නගරයේ විශේෂ කොමසාරිස් ජී. දයානන්ද ද සිල්වා වන මම, ඉහත සඳහන් ප්‍රකාශනය මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1971 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ බලන්ගොඩ නගරයේ ආදායම හා වියදම දක්වෙන සත්‍යවූත්, නිවැරැදිවූත්, ප්‍රකාශනයක් බවට මෙයින් සහතික කරමි.

ජී. දයානන්ද ද සිල්වා,
විශේෂ කොමසාරිස්, බලන්ගොඩ නගරය.

1972 මැයි මස 08 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.
කේ. ඩී. කරුණාරත්න,
සාමදාන විනිශ්චයකාර හා බඹරබොටුව ගම් සභාපති.

12–101—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## ලුණුගල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රය

1973 වර්ෂයේ අය-වැය ලේඛණයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරිවේයයි ගණන් බලන පහත පෙනෙන වැය ශීර්ෂ යටතේ වූ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍යවී ඇති අතිරේක වැය සඳහා එම ශීර්ෂයන් යටතේ යෙදවීමට 1973.09.28 දින පවත්වන ලද ලුණුගල සුළු නගර සභාවේ මාසික රැස්වීමේදී අංක 6 යටතේ සම්මත කරන ලදී.

**මුදල් ඉතිරිවේයයි ගණන් බලන ලද වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(2) (ඩී) තක්සේරු ගාස්තු ... ... | 200 | 0 |
| ඒ.—(2) (ජේ) හදිසි වියදම් ... ... | 240 | 0 |
| බී.—(7) අත්කර ගැනීම ... ... ... | 275 | 0 |
| ඩී.—(2) (බී) කශල ශෝධනය කරත්ත ... ... | 135 | 0 |
| ඩී.—(3) (බී) වැසිකිළි ශෝධනය කරත්ත ... ... | 200 | 0 |
| (ඊ) වැසිකිළි නඩත්තුව ... ... | 300 | 0 |
| ඩී.—(5) (බී) ජල සම්පාදනය ගබඩා ... ... | 1,400 | 0 |
| (සී) නඩත්තුව ... ... | 475 | 0 |
| | 3,225 | 0 |

**කවදුරටත් මුදල් අවශ්‍යවේයයි ගණන් බලන ලද වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඒ) ලේකම් වැටුප් ... ... | 140 | 0 |
| (බී) ලිපිකරු වැටුප් ... ... | 280 | 0 |
| (එච්) විවාහක දීමනා ... ... | 280 | 0 |
| ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 500 | 0 |
| සී.—(9) විදුලිය ගාස්තු ... ... ... | 200 | 0 |
| ඩී.—(1) (එච්) කානු ඉදිකිරීම ... ... | 1,230 | 0 |
| ඩී.—(2) (ඒ) කම්කරු වේතන ... ... | 520 | 0 |
| (ජී) අතිකාල දීමනා ... ... | 25 | 0 |
| ඩී.—(3) (ඒ) කම්කරු වේතන ... ... | 50 | 0 |
| | 3,225 | 0 |

**II කොටස—විදුලිය**

| | රු. | ශ. |
|---|---|---|
| විදු.—(3) (ඒ) වැටුප් ... ... ... | 200 | 0 |
| විදු.—(4) (සී) අතිකාල දීමනා ... ... | 200 | 0 |

ඩී. වී. ඩී. වීරසේකර,
සභාපති,
ලුණුගල සුළු නගර සභාව.

1973 ඔක්තෝබර් 04 වැනි දින,
ලුණුගල සුළු නගර සභා කාර්යාලයේදී.

අනුමත කරමි.

ටී. අයි. කමාල්දීන්,
පලාත් පාලන සහකාර කොමසාරිස්, බදුල්ල.

1973 නොවැම්බර් 03 දින,
බදුල්ල පලාත් පාලන කාර්යාලයේ දීය.

12–856—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## වැලිසර සුළු නගර සභාව

### I වෙනි පරිපූරක අය-වැය ලේඛනය 1973—සාමාන්‍ය කොටස

මෙහි 4 වෙනි තීරයේ සඳහන් පරිදි රු. 10,002.62 පරිපූරක වැයක් අනුමත කිරීමට 1973 ජූනි මස 28 වැනි දින මාසික සභාවේ යෝජනා අංක 7 (VIII) සභා සම්මත විය.

| වැය ශීර්ෂය | අය-වැය ලේඛනය පරිදි අනුමත කර ඇති වියදම රු. ශ. | මෙ දක්වා වියදම රු. ශ. | අවශ්‍ය වී ඇති පරිපූරක වැය රු. ශ. | හේතුන් |
|---|---|---|---|---|
| ඒ.—1 (ඒ) ලේකම් — වැටුප් ... | 5,048 0... | 4,405 53... | 895 0... | III ශ්‍රේණියේ වැඩි වැටුප් ලබන ලේකම් මහතෙක් මාරු කර එවීම නිසා. |
| ඒ.—1 (බී) ලිපිකරුවන් — වැටුප් ... | 18,925 0... | 17,132 84... | 4,323 0... | පළාත් පාලන නිලධාරිනියක් පත් කර එවීම නිසා. |
| ඒ.—1 (ඇප්) විශ්‍රාම වැටුප් ... | — ... | — ... | 364 79... | නැසීගිය කර්මාන්ත ඕවර්සියර් ඇල්. ඩී. බී. ඇන්තනි මහතා වෙනුවෙන් මරණ පාරිතෝෂික මුදලක් ගෙවීම සඳහා. |
| බී.—2 මහා මාර්ග නඩත්තු කිරීම ... | 49,000 0... | 18,751 09... | 2,000 0... | පුලිනතලාරාම පාරේ ඉතිරි කොටසට ගල් පස් දැමීම සඳහා. |
| ඩී.—7 (ඒ) වේතන ... | — ... | — ... | 85 0... | මහජන පොලේ ඉරිද දිනවල ආදයම් එකතු කරන නිලධාරියාට ගෙවිය යුතු සියයට 10 ක කොමිස් මුදල් ගෙවීම සඳහා. |
| ඩී.—7 (බී) වෙළඳ පොලවල් හා ගාල් ... | — ... | — ... | 360 0... | ඇලපිටිවෙල මස් කඩයට 1973 වර්ෂයට කුලී ගෙවීම පිණිස මසකට රු. 30.00 බැගින්. |
| | | | 8,027 79 | |

### II වෙනි කොටස—විදුලි දෙපාර්තමේන්තුව

| | රු. ශ. | රු. ශ. | රු. ශ. | |
|---|---|---|---|---|
| ඊඩී.—3 (එන්) ණය හා පොලිය ... | — ... | — ... | 1,974 83... | වත්කම බෙදීමේදී පැවරුණු රු. 25,000 ක ණය කොටස් සහ පොලිය ගෙවීම සඳහා. |

එච්. රොබට් ප්‍රනාන්දු,
සභාපති,
වැලිසර සුළු නගර සභාව.

1973 ඔක්තෝබර් මස 24 වන දින.

අනුමත කළේ—

ශ. දයානන්ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස්.
(කොළඹ දිසාව)

12–102—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## වතුගෙදර සුළු නගර සභාව

### 1973 වර්ෂයේ අය—වැය ලේඛනය

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40(II) යටතේ වූ අයදුම් පත්‍රයයි

1973 අය වැය ලේඛනයේ පහත සඳහන් වැය ශීර්ෂ යටතේ වෙන්කර ඇති මුදල් වලින් වර්ෂය අවසානයේ ඉතුරුවේ යයි ගණන් බලන ලද පහත සඳහන් උප වැය ශීර්ෂ යටතේ වූ මුදල්, මුදල් අවශ්‍ය වේයයි ගණන් බලා ඇති අවශ්‍ය උප ශීර්ෂයනට මාරු කිරීමට තීරණය කරමි.

#### සාමාන්‍ය අංශය

**මුදල් ඉතුරුවේයයි ගණන් බලා ඇති ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම | | |
| 1. නිළධාරීන්ගේ වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 150 | 0 |
| (සී) ආදායම් ඕවර්සියර් ... ... | 250 | 0 |
| 2. ආයතන වියදම්— | | |
| (බී) ගමන් ගාස්තු ... ... ... | 50 | 0 |
| (ඩී) තක්සේරු ගාස්තු ... ... ... | 300 | 0 |
| (ඇල්) නිළ ඇඳුම් ... ... ... | 25 | 0 |
| බී.—මහා මාර්ග | | |
| 1. වේතන— | | |
| (සී) කම්කරුවන්ට ... ... ... | 1,500 | 0 |
| 2. නඩත්තු කිරීම ... ... ... | 300 | 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | | |
| 7. අළුත් කර්මාන්ත ... ... ... | 500 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය | | |
| 1. සාමාන්‍ය— | | |
| (සී) දීමනා ... ... ... | 10 | 0 |
| (එෆ්) විෂ නාශක ද්‍රව්‍ය ... ... | 50 | 0 |
| 2. කශල ශෝධනය— | | |
| (බී) කරත්ත ගොනුන් සහ ලොරි ... ... | 40 | 0 |
| 3. වැසිකිලි පවිත්‍ර කිරීම— | | |
| (ඊ) වැසිකිළි නඩත්තු කිරීම ... ... | 100 | 0 |
| ජී.—බල්ලන් ලියා පදිංචි කිරීම | | |
| 1. බල්ලන් විනාශ කිරීම ... ... | 100 | 0 |
| | 3,375 | 0 |

**මුදල් අවශ්‍ය වැය ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම— | | |
| 1. නිළධාරීන්ගේ වැටුප්— | | |
| (බී) ලිපිකරුවන් ... ... ... | 1,500 | 0 |
| (ඩී) පියන්වරු ... ... ... | 225 | 0 |
| 2. ආයතන වියදම්— | | |
| (අයි) නිවාඩු දුම්රිය ප්‍රවේශපත්‍ර ... ... | 300 | 0 |
| (ජේ) අනියම් වියදම් ... ... | 100 | 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | | |
| 1. වේතන ... ... ... | 500 | 0 |
| 4. නඩත්තු කිරීම ... ... ... | 350 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය | | |
| 2. කශල ශෝධනය— | | |
| (ඒ) වේතන ... ... ... | 200 | 0 |
| (සී) ගබඩා ... ... ... | 25 | 0 |
| 7. වෙළඳ පොළ්වල් හා ගාල්— | | |
| (ඒ) වේතන ... ... ... | 175 | 0 |
| | 3,375 | 0 |

#### විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී 3.—පාලනය හා සාමාන්‍ය වියදම් | | |
| (ඒ) වැටුප් සහ වේතන ... ... ... | 500 | 0 |
| (බී) විවාහ දීමනා ... ... ... | 50 | 0 |
| (ජී) නිදහස් දුම්රිය බලපත්‍ර ... ... | 100 | 0 |
| (එච්) විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදල් හා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ... ... ... | 400 | 0 |
| (ඕ) රක්ෂන ගාස්තු ... ... ... | 250 | 0 |
| ඊඩී 4.—විදුලි බළය බෙදහැරීම | | |
| (බී) විවාහ දීමනා ... ... ... | 100 | 0 |
| (සී) අතිකාල දීමනා ... ... ... | 100 | 0 |
| | 1,500 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී 4.—විදුලි බලය බෙදහැරීම | | |
| (ඒ) වැටුප් සහ වේතන ... ... | 1,500 | 0 |
| | 1,500 | 0 |

1973.10.29 වන දින සභාවේ අංක 23 දරණ යෝජනාව අනුව සම්මත කරන ලදී.

ඇල්. සී. ද සිල්වා,
සභාපති,
වතුගෙදර සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්‍යාලය,
වතුගෙදර. 1973 නොවැම්බර් මස 12 දින.

12–28—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## බෙන්තොට සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් නීති 40 (11) යටතේ අයදුම් පත්‍රය

### 1973 වර්ෂයේ අයවැය ලේඛනය

1973 වර්ෂයේ අයවැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන්කරන ලද මුදල්වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද මෙහි පහත සඳහන් මුදල්, වැඩිපුර මුදල් අවශ්‍යවේයයි ගණන් බලනලද, ඊට අනුරූපව ඇති වැය ශීර්ෂයන්ට මාරුකර වියදම් කිරීමට 1973 ඔක්තෝබර් මස 31 වැනි දින පැවති බෙන්තොට සුළු නගර සභා රැස්වීමේදී අංක 2(7) දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

| මුදල් ඉතිරිවන වැය ශීර්ෂ | රු. | ශ. | වැඩිපුර මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—2 (සී) බදු අයකරන්නන්ට කොමිස් ... ... | 400 | 0 | ඒ.—4 ආධාර හා දීමනා ... ... ... | 500 | 0 |
| (ඩී) තක්සේරු ගාස්තු ... ... | 100 | 0 | | | |
| මුළු ගණන ... | 500 | 0 | මුළු ගණන ... | 500 | 0 |

#### විදුලි දෙපාර්තමේන්තුව

| | | | | | |
|---|---|---|---|---|---|
| ඊඇල්.—1 (බී) උපරිම ඉල්ලුම් ගාස්තු ... ... | 1,000 | 0 | ඊඇල්.—3 (එන්) ණය සඳහා පොලිය ... ... | 2,489 | 0 |
| 3 (ඒ) වැටුප් හා වේතන ... ... | 1,250 | 0 | 6 (ඒ) 1 නව සේවා පිරිද්දුම් ... ... | 4,250 | 0 |
| (බී) විවාහක දීමනා ... ... | 100 | 0 | | | |
| (සී) අතිකාල දීමනා ... ... | 600 | 0 | | | |
| (ඩී) අනතුරු දීමනා ... ... | 43 | 0 | | | |
| (ඊ) ගමන් වියදම් ... ... | 550 | 0 | | | |
| (ජී) නිදහස් දුම්රිය බලපත්‍ර ... ... | 450 | 0 | | | |
| (එච්) විශ්‍රාම වැටුප් ... ... | 250 | 0 | | | |
| (කේ) බැංකු ගාස්තු ... ... | 50 | 0 | | | |
| (ඕ) රක්ෂණ ගාස්තු ... ... | 250 | 0 | | | |
| (කිව්) විවිධ වියදම් ... ... | 650 | 0 | | | |
| 4 (සී) අතිකාල දීමනා ... ... | 250 | 0 | | | |
| (ඩී) අනතුරු දීමනා ... ... | 96 | 0 | | | |
| 5 (ඒ) ගොඩනැගිලි ... ... | 300 | 0 | | | |
| (බී) මීටර් හා අනිකුත් උපකරණ ... | 900 | 0 | | | |
| මුළු ගණන ... | 6,739 | 0 | මුළු ගණන ... | 6,739 | 0 |

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 2 වැනි දින,
බෙන්තොට සුළු නගර සභා කාර්යාලය.

අනුමත කරමි.

පර්සි අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ගාල්ල.

1973.11.24 දින,
පළාත් පාලන කාර්යාලය,
ගාල්ල.

12–147—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## රාගම සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි 40 (11) යටතේ අයදුම් පත

### 1973 අයවැය ලේඛනය

1973 වර්ෂයේ අයවැය ලේඛනයේ පහත සඳහන් ශීර්ෂය යටතේ වෙන්කරනලද මුදලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත සඳහන් මුදල ඊට අනුරූපව දක්වෙන ශීර්ෂයට මාරුකර අවශ්‍යවී ඇති වැය පියවා ගැනීමට 1973 ක්වූ අගෝස්තු මස 31 වැනි දින පවත්වනලද මාසික රැස්වීමෙ අංක 14(12) දරණ යෝජනාවෙන් සම්මතකරන ලදී.

| ඉතිරිවේයයි ගණන් බලනලද මුදල සහ වැය ශීර්ෂය | රු. | ශ. | අවශ්‍යවේයයි ගණන් බලනලද මුදල සහ වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඩී.—1 (එච්) කාණු ඉදිකිරීම ... ... | 2,000 | 0 | ඒ.—4 ආධාර සහ පරිත්‍යාග ... ... | 2,000 | 0 |

ඇස්. ජේ. ඇස්. ඇන්. පී. අමරසේකර,
සභාපති,
රාගම සුළු නගර සභාව.

1973.9.20 වැනි දින,
රාගම සුළු නගර සභා කායර්ාලයේ දී ය.

අනුමතකරමි.

ග. දයානන්ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
(කොළඹ දිසාව).

1973.11.6,
බම්බලපිටියේ දී ය.

12–138—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## බණ්ඩාරවෙල නගරය

### 1973 වර්ෂයේ 1 වැනි පරිපූරක අයවැය ලේඛනය

1973 වර්ෂයේ 1 වැනි පරිපූරක අයවැය ලේඛනය බණ්ඩාරවෙල නගරය පාලනය කිරීමට පත්කර ඇති විශේෂ කොමසාරිස් වන මා 1973 නොවැම්බර් මස 23 වැනි දින තීරණ අංක 161 යටතේ සම්මත කරන ලදී.

| වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1 (එජ්) අතිකාල දීමනා ... ... | 2,300 | 0 |
| ඒ.—2 (බී) ගමන් වියදම් ... ... ... | 1,100 | 0 |
| ඒ.—2 (එජ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ කටයුතු ... ... | 4,000 | 0 |
| ඒ —2 (ජේ) දුම්රිය ප්‍රවේශ පත්‍ර ... ... | 1,400 | 0 |
| ඒ.—2 (එන්) අතුරු දීමනා ... ... | 5,700 | 0 |
| ඒ.—2 (ඕ) නිළ ඇඳුම ... ... ... | 200 | 0 |
| ඒ.—2 (පී) ලී බඩු හා උපකරණ ... ... | 1,200 | 0 |
| ඒ.—3 ආදයම් ආපසු ගෙවීම ... ... | 25 | 0 |
| ඒ.—4 (I) දයක මුදල් හා ආධාර ... ... | 3,000 | 0 |
| බී.—1 (ඒ) (II) අතිරේක දීමනා ... ... | 50 | 0 |
| බී.—2 මාර්ග පාරවල් නඩත්තුව ... ... | 3,700 | 0 |
| බී.—3 ආවුධ පන්න සහ යන්ත්‍ර ... ... | 800 | 0 |
| බී.—14 සංඥ පුවරු ... ... ... | 100 | 0 |
| ඩී.—1 ගොඩනැගිලි හා ඉඩම් වේතන ... ... | 2,000 | 0 |
| ඩී.—4 නඩත්තුව ... ... ... | 2,000 | 0 |
| ඩී.—13 විවාහක දීමනා ... ... ... | 50 | 0 |
| ඊ.—2 (ඒ) පාර සුද්ධ කිරීම—වේතන ... ... | 3,500 | 0 |
| ඊ.—2 (බී) කරත්ත, ලොරිවලට ... ... | 1,500 | 0 |
| ඊ.—2 (ඩී) වැහි කබා ... ... ... | 50 | 0 |
| ඊ.—3 (බී) කසල ශුද්ධ කිරීම—කරත්ත, ලොරිවලට ... | 1,700 | 0 |
| ඊ.—3 (ඩී) වැහිකබා ... ... ... | 50 | 0 |
| ඊ.—5 (ඒ) ජලය සැපයීම—වේතන ... ... | 3,000 | 0 |
| ඊ.—5 (සී) නඩත්තුව ... ... ... | 6,000 | 0 |
| ඊ.—5 (එල්) විවාහක දීමනා ... ... | 75 | 0 |
| ඊ.—5 (එම්) වෙනත් දීමනා ... ... | 28 | 0 |
| ඊ.—7 (බී) ප්‍රසිඩ වෙළඳපලවල් නඩත්තුව ... ... | 600 | 0 |
| ඊ.—7 (කේ) නිළ ඇඳුම ... ... ... | 50 | 0 |
| ඊ.—7 (එම්) වෙනත් දීමනා ... ... | 200 | 0 |
| එප්.—2 මහජන විනෝදය—නඩත්තුව ... ... | 1,500 | 0 |
| එච්.—1 සුනඛයින් ලියාපදිංචි කිරීම—වැනසීම ... | 200 | 0 |
| අයි.—2 මැනීමේ හා කිරීමේ උපකරණ ගාස්තු ... | 31,900 | 0 |
| එම්.—2 කියවීම්ශාලා හා පුස්තකාල—පොත්පත්, සහරා ආදිය | 500 | 0 |
| එම්.—4 නඩත්තුව ... ... ... | 1,500 | 0 |
| එම්.—8 අතිකාල දීමනා ... ... ... | 75 | 0 |
| | 80,053 | 0 |

ආර්. සෙන්ට් එස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

1973 නොවැම්බර් මස 24 වැනි දින,
බණ්ඩාරවෙල,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

12-143—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## යටියන්තොට විශේෂ කොමසාරිස් කාර්යාලයය

### අංක 40(11) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ කෙරෙන අයදුම පත්‍රය

1973 අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල්වලින්, ඉතිරි වේයැයි ගණන් බලන ලද පහත සඳහන් මුදල්, මුදල් හිඟ වේයැයි ගණන් බලනලද පහත දක්වෙන වැය ශීර්ෂයන්ට කෑගල්ලේ, පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ අනුමතියට සටත්ව මාරු කිරීමට යටියන්තොට නගරයේ විශේෂ කොමසාරිස් වරයා වන මා විසින් 1973 නොවැම්බර් මස 09 වෙනි දින තීරණය කරන ලදී.

### I වැනි කොටස—සාමාන්‍ය අංශය

| මුදල් ඉතිරිවේයැයි ගණන් බලන ලද වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (1) නිලධාරීන්ගේ වැටුප්— | | |
| (එච්) විවාහ දීමනා ... ... | 700 | 0 |
| (2) කායර්‍යාලීය වියදම්— | | |
| (සී) අයබදු තක්සේරු ගාස්තු ... ... | 192 | 0 |
| (ජී) වාහන තහඩු ... ... ... | 28 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (1) වැටුප්— | | |
| (බී) පරීක්ෂක ... ... ... | 100 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ජේ) සෞඛ්‍ය සතිය සඳහා දීමනා ... ... | 150 | 0 |
| (එල්) මැලේරියා මැඩලීම ... ... | 200 | 0 |
| (3) වැසිකිළි ශෝධන— | | |
| (ඒ) වැටුප් ... ... ... | 750 | 0 |
| (5) ජලය සැපයීම— | | |
| (බී) ගබඩා ... ... ... | 430 | 0 |
| | 2,550 | 0 |

| මුදල් හිඟවේයැයි ගණන් බලන ලද වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (1) නිලධාරීන්ගේ වැටුප්— | | |
| (බී) ලිපිකරු මණ්ඩලය ... ... | 325 | 0 |
| (ඩී) කායර්‍යාල සේවක ... ... | 300 | 0 |
| (එෆ්) විශ්‍රාම වැටුප් ... ... ... | 65 | 0 |
| (2) කායර්‍යාලීය වියදම්— | | |
| (එෆ්) ලිපි ද්‍රව්‍ය ... ... ... | 1,000 | 0 |
| (අයි) නිවාඩු දුම්රිය බලපත්‍ර ගාස්තු ... ... | 500 | 0 |
| සී.—සභා ගොඩනැගිලි සහ ඉඩම් :— | | |
| (4) නඩත්තුව ... ... ... | 10 | 0 |
| ජේ.—කියවීම් ශාලා සහ පොත්ගුල් :— | | |
| (4) ලී බඩු ... ... ... | 350 | 0 |
| | 2,550 | 0 |

විදුලි අංශය

පුනරාවර්තන වියදම්

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. භොග වශයෙන් මිලදී ගැනීම— | රු. | ශ. | 3. පාලනය හා සාමාන්‍ය වියදම්— | රු. | ශ. |
| (ඒ) විදුලිය ගාස්තු ... ... ... | 275 | 0 | (ජී) නිදහස් දුම්රිය බලපත්‍ර ... ... | 150 | 0 |
| 3. පාලනය හා සාමාන්‍ය වියදම්— | | | (ජේ) ලිපි ද්‍රව්‍ය ... ... ... | 600 | 0 |
| (ඊ) ගමන් වියදම් ගාස්තු ... ... | 500 | 0 | 4. විදුලි බලය බෙදා හැරීම— | | |
| 5. නඩත්තුව සහ අලුත්වැඩියාව— | | | (ඒ) වැටුප් සහ වේතන ... ... | 75 | 0 |
| (ඒ) ගොඩනැගිලි ... ... ... | 100 | 0 | (සී) අතිකාල දීමනා ... ... | 350 | 0 |
| 6. පාරිභෝගිකයින් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත— | | | | | |
| (බී) කම්කරු ගාස්තු : | | | | | |
| (1) තාවකාලික ... ... ... | 300 | 0 | | | |
| | 1,175 | 0 | | 1,175 | 0 |

නීල් ඩයස්,
විශේෂ කොමසාරිස්.

1973.11.15 වෙනි දින,
යටියන්තොට නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කෑගල්ල.

1973.11.22 වෙනි දින,
කෑගල්ලේ,
පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දීය.

12-185/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

යටියන්තොට නගරය

1973 වර්ෂයේ III වැනි පරිපූරක වැය ලේඛනය

I වෙනි කොටස—සාමාන්‍ය අංශය

| වැයශීර්ෂය | මුදල |
|---|---|
| ජී. සාමාන්‍ය වියදම් | රු. ශ. |
| (4) දායක මුදල් හා ආධාර ... ... | 2,000 0 |

යටියන්තොට නගරය පාලනය කිරීමට පත්කර ඇති විශේෂ කොමසාරිස් වන මා විසින්, කෑගල්ලේ, පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයට යටත්ව, 1973.11.09 වන දින තීරණය කරන ලදී.

නීල් ඩයස්,
විශේෂ කොමසාරිස්, යටියන්තොට නගරය.

1973 නොවැම්බර් මස 14 වෙනි දින,
යටියන්තොට නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කෑගල්ල.

1973.11.22 වෙනි දින,
කෑගල්ලේ, පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දීය.

12-185/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

උප ලේඛනය

කුරුණෑගල මහ නගර සභාව

නිවාස හා නගර සංවර්ධන ආඥාපනත (268 වන අධිකාරය) 48 (4) වන වගන්තිය යටතේ අලුතින් පාරක් පවරා ගැනීම පිළිබඳ නිවේදනය මහජනයා වෙත දනුම් දෙනු ලැබේ.

| පාරේ නම | දිග | පළල |
|---|---|---|
| 1. ඇලගුපිටියේ සිට වැහැර ගම දක්වා අතුරු පාර ... ... ... | අඩි 1,300 ... | අඩි 12 |
| 2. මීගමු පාරෙන් බෙදී අංක 284/1 සිට 10 දක්වා යන පාර ... ... ... | අඩි 925 ... | අඩි 30 |

12-29—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## නුවරඑළිය මහ නගර සභාව

### 1974 වර්ෂයට සත්ව හා වාහන බද්ද

නුවරඑළිය මහ නගර සභාව විසින් —

(1) මහ නගර සභා ආඥාපනතේ (252 වෙනි අධිකාරය) 245 වෙනි ඡේදයට අනුව පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි පහත සඳහන් උප ලේඛනයේ 1 වෙනි උප වගන්තියෙන් දක්වා ඇති වාහන හා සත්වයින් වෙනුවෙන්, එහි 11 වෙනි උප වගන්තියෙන් දැක්වෙන ගණන් අනුව බද්දක් පනවා ඇති බවද,

(2) එකී ආඥාපනතේ 245 (2) ඡේදය අනුව එකී බදු මුදල් 1974 වර්ෂයේ මාර්තු මස 31 වෙනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බවද, මෙයින් දැනුම් දෙමි.

ඩී. ඩබ්ලිව්. සමරතුංග,
නාගරික කොමසාරිස්, නුවරඑළිය.

මහ නගර සභා කාර්යාලය,
නුවරඑළිය,
1973 නොවැම්බර් මස 20 වෙනි දින දීය.

### උපලේඛනය

| I<br>වාහන හා සත්වයින්ගේ විස්තර | II<br>වාර්ෂික බදු මුදල<br>රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් පා පැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පා පැදි හැර වෙන යම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 10 | 0 |
| ඕනෑම පා පැදියක්, රෝදත්‍රයේ පා පැදියක් හෝ පා පැදි මෝටර් රථයක් හෝ, කරත්තයක් හෝ, රෝදත්‍රයේ මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම ... | 5 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙනත් කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම ... ... ... | 1 | 50 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් සඳහා— | | |
| (අ) කුලියට දිවීමේ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම | 8 | 0 |
| (ආ) පෞද්ගලික කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම ... | 5 | 0 |
| තනි ගොනා බැඳි සෑම කරත්තයක් සඳහා— | | |
| (අ) කුලියට දිවීමේ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම | 6 | 0 |
| (ආ) පෞද්ගලික කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම ... | 3 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 5 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... ... | 3 | 0 |
| සෑම අශ්වයෙක්, අශ්වතරයෙක් හෝ පෝනියෙක් සඳහා ... | 5 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 2 | 0 |

12–146/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## නුවරඑළිය මහ නගර සභාව

### 1974 වර්ෂයට සුනඛ බද්ද

නුවරඑළිය මහ නගර සභාවේ පාලන සීමාව තුළ ඇති කරනු ලබන සෑම බල්ලෙකු සහ සෑම බැල්ලියක සඳහා 1974 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු. 2.00 සහ රු. 4.00 බැගින්, 1974 වර්ෂයේ මාර්තු මස 31 වෙනි දින හෝ ඉන් පෙර හෝ ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි අධිකාරය) 4 වෙනි ඡේදයට අනුකූලව පනවා අය කිරීමට මෙම නගර සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩී. ඩබ්ලිව්. සමරතුංග,
නාගරික කොමසාරිස්, නුවරඑළිය.

මහ නගර සභා කාර්යාලය,
නුවරඑළිය,
1973 නොවැම්බර් මස 20 වෙනි දින දීය.

12–146/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## මහනුවර නාගරිකය

### 1974 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය

1974 වර්ෂය සඳහා ඇස්තමේන්තු ආදායම් සහ යෝජිත වියදම් පිළිබඳ විස්තර ඇතුළත් මහනුවර නාගරිකයේ කෙටුම්පත් අයවැය ලේඛනය, 1973 දෙසැම්බර් මස 7 වැනි දින සිට දින හතක්, මහජනයාගේ පරීක්ෂණය සඳහා නගර සභා කාර්යාලයේ විවෘතව තබන බව, මහ නගර සභා ආඥාපනතේ (252 පරිච්ඡේදය) 212 (බී) වගන්තියේ ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

ඇම්. බී. සමරකෝන්,
විශේෂ කොමසාරිස්, මහනුවර.

1973 නොවැම්බර් මස 29 දින, මහනුවර නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

12–283—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## ගෙවල් කුලී පනත

### හම්බන්තොට නගර සභාව

1972 මැයි මස 20 වැනි දින ලංකාණ්ඩුවේ අංක 15,011/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ 1972 අංක 7 දරණ ගෙවල්කුලී පනතේ 43 වැනි වගන්තිය සහ 46(2) (ඇ) වැනි වගන්තිය යටතේ නිවාස හා ගොඩනැගිලි ඇමතිතුමා විසින් පනවනු ලැබූ නියෝග මාලාවේ අංක 3 දරණ නියෝගය අනුව කෙරෙන දැනුම් දීමයි.

1972 අංක 7 දරණ ගෙවල් කුලී පනතේ ඇතුලත් විධිවිධාන අනුව හම්බන්තොට නගර සභා ප්‍රදේශයට සීමිතවූ ගෙවල් කුලී මණ්ඩලය වෙත එවන ඉල්ලුම් පත් හා ලිපි පහත සඳහන් කර ඇති ලිපිනයට එවිය යුතුයි. :—

සභාපති,
ගෙවල් කුලී මණ්ඩලය,
හම්බන්තොට නගර සභා ප්‍රදේශය,
හම්බන්තොට නගර සභා කාර්යාලයේ පිහිටි
ගෙවල් කුලී මණ්ඩල කාර්යාලය,
හම්බන්තොට.

එකී ආඥාපනත යටතේ යථෝක්ත මණ්ඩලය වෙත ලැබෙන අයදුම් පත් සලකා බැලීම සඳහා මණ්ඩලයේ රැස්වීම් පහත සඳහන් කරනු ලබන ස්ථානයෙහි පවත්වනු ලැබේ.

හම්බන්තොට නගර සභා ගොඩනැගිල්ලේ පිහිටි ගෙවල් කුලී මණ්ඩල කාර්යාලය.

වී. එස්. බූල්,
සභාපති,
හම්බන්තොට, ගෙවල් කුලී මණ්ඩලය.

හම්බන්තොට නගර සභා ගොඩනැගිල්ලේ පිහිටි
හම්බන්තොට ගෙවල් කුලී මණ්ඩල කාර්යාලයේදීය.
1973.9.29

12–18—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

දර ගබඩාවක් පවත්වාගෙන යාම.
හිරිගල් හෝ හුණු ගල් සඳහා හැරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්මලක් පවත්වාගෙන යෑම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්මලක් පවත්වාගෙන යාම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම.

හිස් බෝතල හෝ හිස් ගෝනි ගබඩාකර තබාගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යෑම.

අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම.
පොල්කටු ගබඩා කර තබාගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර කඩදාසි හෝ ගබඩා කර තබාගැනීම
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ වීවීම.
අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.

සිල්ක් සහ කෘත්‍රිම රෙදි වීවීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

## II කොටස

### අප්‍රසන්න ව්‍යාපාර

මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබාගැනීම.
පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම්කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
හම් ගබඩා කර තබාගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් උම්බල කඩ ගබඩා කර තබා ගැනීම.

කුකුලන් 100ට වැඩි ගණන් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් 10ට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යෑම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.
කරවල, ලුණු මාළු හෝ ජාඩි හොණ්ඩර 3ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දුව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබාගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබාගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.

පුන්නක්කු ටොන් 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම.
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැස්වීම.
සබන් නිෂ්පාදනය කිරීම
සව් හෝ මඤ්ඤොක්කා හැටි (ටැපියෝකා) නිපදවීම.

ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.
ට්‍රන්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබාගැනීම.
ලෝහමය සුනුබුන් ද්‍රව්‍ය ගබඩා කර තබාගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබාගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබාගැනීම.
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.

රස කැවිලි වර්ග නිපදවීම.
ජෙලි හෝ දුව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ෂණය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම.
ඇසිඩ වර්ග නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම.
හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.
පෑණ නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම.

පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයකින් ගබඩා කර තබා ගැනීම.
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
කෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩාකර තබා ගැනීම.
සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලාවක් පවත්වාගෙන යෑම.
පලතුරු, මාලු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇහිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග කෙටීම.

බේකින් පවුඩර් නිපදවීම.
මාජරින් නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.
පොටි නිපදවීම.
ඉටිපන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.

සුවඳ පුයර නිපදවීම.
පාසැල් රටහුණු නිපදවීම.
ටයර් කට්ට කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදසි නිපදවීම.
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.
පාසැල් ගල්ලෑලි නිපදවීම.
සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම.
ශීත කළ මස් හෝ මාලු ගබඩා කර තැබීම.

කපාපු පොල් නිපදවීම.
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.
මැණික් ගල් කැපීම හා ඔප දැමීම.
දිය හුණු, සුදු (වයිටින්) හුණු හෝ හිරිගල් නිපදවීම.
එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

කලාතු මිනිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, එන්සාල් (කරදමුංගු) හෝ කෙඳි වර්ග සකස් කිරීම.
ඩ්‍රයික්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.
රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
තෙල් හෝ සත්ව මේද පැසවීම.
හුණු පිලිස්සීම, සකස්කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.
මැටි බඳුන් ඔප දැමීම.

ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබාගැනීම.
හොණ්ඩර 3ට වැඩියෙන් තේ ගබඩා කර තබාගැනීම.
බැටරි චාජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

වෑල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පොලක් පවත්වාගෙන යෑම.
බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යෑම.
බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යෑම.
ගල් ස්මාරක නිපදවීම.
පැට්‍රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.

පැට්‍රෝල් නිකුත්කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.

පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.
කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම.
විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කව (කොයිල්ස්) නිපදවීම.
ලී දඩු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.
රබර් ද්‍රාවක හෝ රබර සිමෙන්ති නිපදවීම.
ගල්තාර හෝ වෙනත් බිටුමත්මය නිෂ්පාදන නිපදවීම.

විදුරු භාණ්ඩ නිපදවීම.
විදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.
බෙලෙක් බඳුන්, වාතේ පයිප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.
ජී. අයි. බාල්දි නිපදවීම.

වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ (ඩීප්ප්‍රීසර්) නිපදවීම.
සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
බ්‍රෙක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.
විදුලි හා භාණ්ඩ නිපදවීම.
රබර් කැවුනු කෙඳි වර්ග නිපදවීම.
සංචායක බැටරි නිපදවීම.

වියලි කෝෂ බැටරි නිපදවීම.
ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.
රේඩියේටර නිපදවීම.
විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යෑම.

12–171/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය.

---

## ජා–ඇල නගරය

### නගරසභා ආඥපනත

### 1974 වර්ෂය සඳහා වූ දේපළ බද්ද

(255 වෙනි අධිකාරය වන) නගර සභා ආඥපනත යටතේ මෙම ගතවී යන වර්ෂයට බල පවත්වන පහත සඳහන් වරිපනම් බදු, ජා–ඇල නගරයේ පරිපාලන සීමාව තුළ 1974 වර්ෂයට ද එලෙසම පැනවීමට ජා–ඇල නගරයේ විශේෂ කොමසාරිස්වරයා තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එනම්—

160 (3) වෙනි වගන්තිය ප්‍රකාර මෙම ජා–ඇල නගර සීමාව තුළ තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට නවය (9%) බැගින් වූ දේපළ බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි අවසන් වන පරිදි සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන අයුරිනි.

කේ. ඒ. සිල්වා,
විශේෂ කොමසාරිස්,
ජා–ඇල නගරය.

1973 නොවැම්බර් මස 23 වැනි දින,
ජා–ඇල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේදීය.

12–180—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## තලවාකැලේ-ලිඳුල නගර සභාව—නුවරඑළිය දිස්ත්‍රික්කය

### ගෝ ඝාතක ආඥපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් වන අය විසින් එහි දක්වෙන ස්ථානයේ 1974 වර්ෂය තුළ මස් කඩ පවත්වාගෙන යාම සඳහා අයදුම් කර ඇති බවත්, ඒ අනුව ඔවුනට බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව තලවාකැලේ- ලිඳුල නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධත්වය පළ කරන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවිය යුතු බවත්, ගෝඝාතක ආඥපනතේ (272 අධිකාරයේ) 7 (2) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරු | වෙළඳාම් සම්බන්ධය | වෙළඳ ස්ථානය |
|---|---|---|---|
| 1. | එස්. එම්. කමාල්දීන් | හරක් මස් | අංක 1 පොදු වෙළඳපල |
| 2. | සී. කන්දසාමි | හරක් මස් | අංක 2 පොදු වෙළඳපල |
| 3. | එස්. අබ්දුල් කරීම් | එළු මස් | අංක 1 පොදු වෙළඳපල |

එඩ්මන්ඩ් වනිගසේකර,
සභාපති,
තලවාකැලේ- ලිඳුල නගර සභාව.

1973 නොවැම්බර් මස 16 වැනි දින,
තලවාකැලේ- ලිඳුල නගර සභා කාර්යාලයේ දීය.

12–95—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

### 1974 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

පළාත් ආණ්ඩු සභා ආඥපනතේ (255 වන අධිකාරය) 162 වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයෙහි නම් කරන ලද රථවාහන හා සතුන් පිළිබඳ එම උපලේඛනයෙහි සඳහන් කොට තිබෙන පරිදි ගාස්තුවක්, ගෙවී යන වර්ෂයේ බල පැවැත්වෙමින් පවතින පිළිවෙලට 1974 වර්ෂයටද ගම්පහ පළාත් ආණ්ඩු සභාව විසින් පනවා ඇති බවත්, යථෝක්ත ආඥපනතේ 163(3) වගන්තිය යටතේ එකී බදු 1974 පෙබරවාරි 28 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| | | රු. | ශ. |
|---|---|---|---|
| 1. | ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් | 4 | 0 |
| 2. | ඕනෑම අන්දමක තනි ගෙනා බඳින කරත්තයක්, තිරික්කලයක් හෝ අත් කරත්තයක් වෙනුවෙන් | 2 | 0 |
| 3. | ඕනෑම ජින් රික්ෂෝ රථයක් වෙනුවෙන් | 2 | 50 |
| 4. | ඕනෑම අශ්වයෙක්, අශ්ව පෝනියෙක් හෝ බූරුවෙක් වෙනුවෙන් | 2 | 50 |
| 5. | ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ ට්‍රයිසිකලයකට— | | |
| | (ඒ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම් | 3 | 50 |
| | (බී) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම් | 1 | 0 |

කේ. ඇන්. ඕ. ජිනසේන,
ගම්පහ නගර සභාවේ සභාපති.

1973 ක්වූ නොවැම්බර් මස 19 වැනි දින,
ගම්පහ පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දීය.

12–62/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

### 1974 සුනඛ බද්ද

(477 වන අධිකාරය) වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනතේ 4 වෙනි කොටස ප්‍රකාර, ගම්පහ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ තබාගන්නා සෑම බල්ලෙකු සඳහා රු. 1.00ක් ද, සෑම බැල්ලියක් සඳහා රු. 1.00ක් ද ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1974 වර්ෂයට පනවා ඇති බවත්, එකී ගාස්තු 1974 අප්‍රේල් 1 වන දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ඇන්. ඕ. ජිනසේන,
ගම්පහ නගර සභාවේ සභාපති.

1973 නොවැම්බර් මස 19 වැනි දින,
ගම්පහ පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දීය.

12–62/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### යටියන්තොට නගරය

### 1974 වර්ෂය සඳහා වූ දේපල බද්ද

සුළු නගර සභා ආඥපනත (256 වැනි අධිකාරිය) යටතේ ගතවී යන මෙම වර්ෂයට බල පවත්නා පහත සඳහන් බදු 1974 වර්ෂයට ද එලෙසම පැනවීමට යටියන්තොට නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් විසින් තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සීමාව තුල පිහිටා තිබෙන සියලුම නිශ්වල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට (7) හතක බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දායින් අවසන් වන අයුරු කාර්තුව වශයෙන් ගෙවිය හැක.

නීල් ඩයස්,
විශේෂ කොමසාරිස්,
යටියන්තොට නගරය.

1973 නොවැම්බර් මස 26 වැනි දින,
යටියන්තොට නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දිය.

12–78/1—73.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

### යටියන්තොට නගරය

### 1974 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරිමේ ගාස්තු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනතේ (477 වැනි අධිකාරිය) 4 වැනි වගන්තිය ප්‍රකාර යටියන්තොට සුලු නගර සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලකු වෙනුවෙන් රුපියල් 1ක් ද, බැල්ලියක වෙනුවෙන් රුපියල් 1.50ක් ද, ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1974 වර්ෂයට පනවා ඇති බද්ද, එකී ගාස්තුව 1974 වර්ෂයේ මාර්තු 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බව යටියන්තොට නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නීල් ඩයස්,
විශේෂ කොමසාරිස්,
යටියන්තොට නගරය.

1973 නොවැම්බර් මස 26 වැනි දින,
යටියන්තොට නගරයේ,
විශේෂ කොමසාරිස් කායර්ාලයේ දිය.

12–78/2—73.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

### යටියන්තොට නගරය

### 1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

යටියන්තොට නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

1. සුලු නගර සභා ආඥපනතේ (256 වැනි අධිකාරියේ) අංක 161 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව 1974 වර්ෂයට රථ වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අයකිරීමට ද,

2. එකී ආඥ පනතේ 162 (3) දරණ වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින් ද වේ.

නීල් ඩයස්,
විශේෂ කොමසාරිස්,
යටියන්තොට නගරය.

1973 නොවැම්බර් මස 26 වැනි දින,
යටියන්තොට නගරයේ,
විශේෂ කොමසාරිස් කායර්ාලයේ දිය.

### උපලේඛනය

| | | රු. | ශ. |
|---|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් සයිකල්, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පා පැදි හැර වෙන යම් ඕනෑම වාහනයක් සඳහා | ... | 5 | 0 |
| සෑම පාපැදියකට හෝ රෝදත්‍රයේ පාපැදියකට හෝ පාපැදි කාරයකට හෝ කරත්තයකට හෝ රොදත්‍රයේ පාපැදි කාරයකට හෝ කරත්තයකට— | | | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කෙරේ නම් | ... | 4 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කාර්යක් සඳහා පාවිච්චි කෙරේ නම් | ... ... | 1 | 0 |
| සෑම ගොන් බඳින කරත්තයක් සඳහා | ... ... | 4 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... | ... ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා | ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා | ... | 5 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා | ... ... | 1 | 0 |

12–78/3—73.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

### කලුතර නගර සභාව

### ජලභීතිකා රෝගය

කලුතර නගර සභා සීමාව තුළ පිස්සු බලු උවදුර ඇති හෙයින්, පෞද්ගලික ස්ථානයක්, මිදුලක්, වත්තක් හැර වෙන ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක හෝ මාර්ගයක සිටින්නාවූ බැඳ නොතබන ලද හෝ කෙනෙකු විසින් ගෙන යනු නොලබන ඕනෑම බල්ලකු හෝ බැල්ලක මගේ ලියවිල්ලකින් බලයලත් ඕනෑම කෙනෙකු විසින් සැනෙකින්ම විනාශ කර දැමීමට ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ (476 වෙනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥපනතේ II වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම දැන්වීම ගැසට් පත්හි පළ වන දින සිට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

එල්. ජී. ඊ. වික්‍රමසේකර,
බලයලත් නිලධාරි,
කලුතර නගර සභාව.

1973 නොවැම්බර් මස 15 වැනි දින,
කලුතර නගර සභා කාර්යාලයේදිය.

12–16—73.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

### බණ්ඩාරවෙල නගරය

### ජලභීතිකා රෝගය

බණ්ඩාරවෙල නගර සීමාවන්ට අයත් වන ප්‍රදේශය තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් (ලංකා ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි අධිකාරය වන) ජලභීතිකා රෝග පිළිබඳ ආඥපනතේ 11 (1) වැනි වගන්තිය ප්‍රකාර, එකී නගර සීමා ප්‍රදේශය තුළ පිහිටි ගොඩනැගිල්ලක, ගෙමිදුලක නැතහොත් ගෙවත්තක නොවන්නා වූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන, බැඳ නොතබන ලද්දූ වූ නැතහොත් දක්කාගෙන නොයනු ලබන්නා වූ යම්කිසි බල්ලෙකු හෝ බැල්ලියක මා විසින් ලියවිල්ලකින් දෙන ලද බල පත්‍රයක් ලත් අයකු විසින් එවෙලේම විනාශ කරනු ලබන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1974 ජනවාරි මස 1 වැනි දින සිට 1974 ජූනි මස 30 වැනි දින දක්වා මාස හයක කාල සීමාවකට වලංගු වන්නේය.

ආර්. සෙන්ට් එස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

1973 නොවැම්බර් මස 23 වැනි දින,
බණ්ඩාරවෙල,
විශේෂ කොමසාරිස් කාර්යාලයේදිය.

12–142—73.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

### මඩහපොල ගම් සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයේ 1974 වර්ෂය තුල මස් මැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් අයදුම් කර ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉහළ ඕතොට කෝරළයේ මඩහපොල ගම්සභා ප්‍රදේශය තුල ස්ථිර පදිංචි ඕනෑම අයෙකු හෝ සංවිධානයක විරුද්ධතාවයක් ඇත්නම් එය විස්තර සහිත ලිපියකින් පිටපත් දෙකක් සිටින සේ සකස් කොට මෙම දැන්වීම ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට සති දෙකක් ඇතුළත මා වෙත එවීමට අවසර ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | මරණ සතුන් පිළිබඳ විස්තර | ස්ථානය |
| --- | --- | --- |
| 1. ඇම්. එච්. ඇම්. සාඩලින්, " සම් සම් " ස්ටෝර්ස්, මැල්සිරිපුර ... | එළ හරක් ... | ... මායිවෙල–නිකලන්දගාල නමැති ඉඩම |

අයි. ඇම්. තිලකරත්න,
මඩහපොල ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සභාපති.

1973 නොවැම්බර් මස 27 වැනි දින,
ගම්සභා කාර්යාලය, මඩහපොල.

12–189—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### දියපොටගම් පත්තු ගම් සභාව—ඇඹිලිපිටිය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් දක්වෙන ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1974 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන දියපොටගම් පත්තු ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඩ වන්නේ අසවල් කරුණු මතයැයි දක්වෙන පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම ගැසට් පත්‍රයේ දින සිට දින දහතරක් (14) ඇතුළත මා වෙත එවන ලෙස ඉල්ලා සිටින බවත්, ගෝඝාතක ආඥාපනතේ (සංශෝධිත ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 272 වන අධිකාරය) 7 (2) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
| --- | --- | --- |
| 1. ඇෆ්. අයි. ඇම්. සිද්දික්, 15, ශ්‍රීපාද මාවත, රත්නපුර ... | කැටකැලගහ වත්ත, පල්ලෙගම ... | ... ගව මස් |

ඩී. ජේ. ආර්. දිසානායක,
දියපොටගම්පත්තු ගම් සභාවේ සභාපති.

1973 නොවැම්බර් මස 22 වැනි දින,
ගම්සභා කායඹාලය, ඇඹිලිපිටිය.

12–182—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### වැල්ලවාය ගම් සභාව

### ගෝ ඝාතක ආඥාපනත (272 වෙනි අධිකාරය)

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (සංශෝධිත ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන විරෝධතාවයක් දක්වීමට අදහස් කරන වැල්ලවාය ගම්සභා ප්‍රදේශ සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට ඔහුගේ හෝ ඇගේ විරෝධතාවය සඳහා හේතු පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින්, මෙම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින දහහතරක් (14) ඇතුලත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
| --- | --- | --- |
| ජේ. ඒ. ඇම්. හුසේන්, 10 කණුව, පස්සර ... | ... වැල්ලවාය පොදු වෙළඳපොල ... | ගව මස් හා එළු මස් වෙළඳාම |

ආර්. ඩබ්ලිව්. ඒ. ඩී. රණසිංහ,
සභාපති,
වැල්ලවාය ගම්සභාව.

1973 නොවැම්බර් මස 26 වැනි දින,
වැල්ලවාය ගම්සභා කාර්යාලයේ දී ය.

12–181—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## කඳාන නගරය

### 1974 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරයේ) 161 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ එම වාහන සහ සතුන් ඉදිරියෙහි සඳහන් කර තිබෙන ගණන් අනුව රථ වාහන සහ සතුන් පිළිබඳ බද්දක් ගෙවී යන 1973 වර්ෂයට මෙන්ම 1974 වර්ෂයටද පනවා ඇති බව සහ,

(2) යථෝක්ත ආඥාපනතේ 162(3) වෙනි වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්ය.

බී. එන්. එෆ්. මෙන්දිස්,
විශේෂ කොමසාරිස්, කඳාන නගරය.

1973 නොවැම්බර් මස 23 වැනි දින,
කඳාන විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රොදත්‍රයේ හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රථයක්, කරත්තයක්— | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 2 | 50 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... ... | 3 | 0 |
| තනි ගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | 2 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 | 0 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ... | 3 | 0 |

12–206—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## කෝට්ටේ නගරය

### පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන, හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1972 ජනවාරි 07 වෙනි දිනෙන් (261 වෙනි අධිකාරය වන) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තිය ප්‍රකාර අංක 15001 හා 1972.03.10 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රකාශයට පත් කරණ ලද යට දක්වෙන සංශෝධිත අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත්, එය 1974 ජනවාරි මස 01 දින සිට කෝට්ටේ නගරයේ විශේෂ කොමසාරිස් තැනගේ පාලන සීමාව තුළ ක්‍රියාත්මක කිරීමටත් තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඔලිවර් ගුරුසිංහ,
විශේෂ කොමසාරිස්,
කෝට්ටේ නගරය.

1973 නොවැම්බර් මස,
රාජගිරිය, කෝට්ටේ නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයයේ දීය.

### අතුරු ව්‍යවස්ථාව

කලින් කළ සංශෝධනය කරන ලද පරිදි වූ 1953 නොවැම්බර් මස 6 වැනි දින අංක 10,609 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා වල VIII වැනි කොටසෙහි අන්තරාදයක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට, පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදයක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ". තවද,

(2) 16 වැනි අතුරු ව්‍යවස්ථාවට ඉක්බිතිවම පහත දක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

#### උපලේඛනය

#### I වැනි කොටස

#### අන්තරාදයක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළුගල් කැනීම.
කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.
සිසිල් බීම නිෂ්පාදනය.
ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම.
අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිශ්කර්ෂණය.
ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබා ගැනීම.
පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12 වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනි පෙට්ටි ගබඩා කර තබා ගැනීම.
ඉඹුල් පුළුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම.

මැනිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පිදුරු ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.
කුළියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.

ධාන්‍ය හෝ මාෂ බෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙණ ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.
දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.
දර ගබඩාවක් පවත්වාගෙන යාම.
හිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙණ කම්මලක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙණ කම්මලක් පවත්වාගෙන යෑම,
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුනු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපළක් පවත්වාගෙන යෑම.
අළුත් හෝ පාවිච්චි කරණ ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පොල් කටු ගබඩා කර තබා ගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරණ ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
අයත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ වියීම.
අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් පෙද නිපදවීම.

සිල්ක් සහ කෘත්‍රිම රෙදි වියීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

#### II වැනි කොටස

#### අප්‍රසන්න ව්‍යාපාර

මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
හම් ගබඩා කර තබා ගැනීම.

උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.

කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පශු වෛද්‍ය ශිල්පීන් හලක් පවත්වාගෙන යෑම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

කරවල, ලුනු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම, හෝ අයිස් දැමීම.

අඟුරු සඳහා දව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.
පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම.

සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මංඤොක්කා කැටි (ටැපියෝකා) නිපදවීම.

ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.

ටින්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.

සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ශනය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

ටිනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.
පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

පින්තාරු තීන්ත, වාර්නිස් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයකින් ගබඩා කර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
කෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.
කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.

සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාෂ බෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම.

බේකිං පවුඩර් නිපදවීම.
මාජරින් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.
පොටි නිපදවීම.

ඉටිපන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කුඩු නිපදවීම.
ලා කඩ නිපදවීම.

සුවඳ සුයර නිපදවීම.
පාසල් රටහුනු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
වැලි කඩදසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.
පාසල් ගල් ලෑලි නිපදවීම.

සෝඩා තුවා කඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.
ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම.

කපාපු පොල් නිපදවීම.
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.

මැණික්ගල් කැපීම හා ඔපදැමීම

දිය හුණු, සුදු (වයිටිං) හුණු හෝ හිරිගල් නිපදවීම.
එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිණිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.

ඩ්‍රයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.
රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම.
මැටි බඳුන් ඔප දැමීම.

ගිණි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම.

බැටරි චාර්ජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
වෑල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යෑම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යෑම.
බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යෑම.

ගල් ස්මාරක නිපදවීම.
පැට්‍රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.

පැට්‍රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.

පොලිස් හෝ ඉටි වර්ග නිපදවීම.
කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.
මදුරු කව (කොයිල්ස්) නිපදවීම.

ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.
රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.

ගල්තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.
වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.
පාස්සන ඊයම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
කටු කම්බි නිපදවීම.

කම්බි ඇන නිපදවීම.
කාබන් කඩදසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.
ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, ශීත කරණ හෝ අධි ශීතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම.
සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.
යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.
රබර් කැවුනු කෙඳිවර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.
වියලි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.
රේඩියේටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරණ වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පලක් පවත්වාගෙන යෑම.

12-214—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### කෝට්ටේ නගරය

(272 වැනි අධිකාරය) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත

මෙහි පහත දැක්වෙන උපලේඛණයේ සඳහන් අය විසින්, පහත සඳහන් මස් වෙළඳ සැල්හි මස් විකිණීම සඳහා 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන, කෝට්ටේ නගර සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, (272 වැනි අධිකාරය) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛණය

| | බලපත්‍ර ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳ සැල් විස්තර |
|---|---|---|
| 1 | එස්. පී. එන්. ඒ. කරීම් මහතා, අංක 93, විවේකානන්ද හිල්, කොළඹ... | අංක 1, 2 සහ 3 හරක් සහ එළුමස් වෙළඳ සැල්, ප්‍රසිද්ධ වෙළඳ සැල, නුගේගොඩ අංක 4 හරක් මස් වෙළඳ සැල, ප්‍රසිද්ධ වෙළඳ සැල, පිට කෝට්ටේ ජම්බුගස් මුල්ල පටුමගෙහි පිහිටි හරක් මස් වෙළඳ සැල |

ඔලිවර් ගුරුසිංහ,
විශේෂ කොමසාරිස්, කෝට්ටේ නගරය.

1973.11.29 දින,
විශේෂ කොමසාරිස් කාර්යාලය,
කෝට්ටේ නගරය, රාජගිරිය.

12 235—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### නාරම්මල සුළු නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ අය එහි සඳහන් කොට ඇති ස්ථානවල 1974 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යෑමට බලපත් ඉල්ලුම් කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි පරිච්ඡේදයේ) අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධිත වූ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන නාරම්මල සුළු නගර සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ විරුද්ධ වන්නේ කුමක් නිසාද යන වග සඳහන් පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහතරක් ඇතුළතදී මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

එස්. එම්. බී. කේ. සුබසිංහ,
නාරම්මල සුළු නගර සභාවේ සභාපති.

1973 නොවැම්බර් මස 21 වැනි දින,
නාරම්මල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඒ. ඒ. එම්. යාකුබ්, 34, පුත්තලම් පාර, කුරුණෑගල ... | එළ හරක් මස් ... | නාරම්මල පොදු වෙළඳ සැල, අංක 1 දරණ හරක් මස් කඩය |
| 2. | එස්. එල්. එම්. ජබීර් අඹහේන්වැව, පහමුනේ ... | එළ හරක් මස් ... | නාරම්මල පොදු වෙළඳ සැල, අංක 2 දරණ හරක් මස් කඩය |
| 3. | එස්. එල්. එම්. ජබීර්, අඹහේන්වැව, පහමුනේ ... | එළු මස් ... | නාරම්මල පොදු වෙළඳ සැල, අංක 1 එළු මස් කඩය |
| 4. | එස්. එල්. එම්. ජබීර්, අඹහේන්වැව, පහමුනේ ... | කුකුල් මස් ... | නාරම්මල පොදු වෙළඳ සැල, අංක 1 කුකුල් මස් කඩය |

12-96—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### කොටිකාවත්ත සුළු නගර සභාව

1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

256 වන සුළු නගර සභා ආඥාපනත

කොටිකාවත්ත සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වන අධිකාරිය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1974 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 (2) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු 31 වෙනිදට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන අන්දමේ වාහනයක් සඳහා ... ... | 5 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් :— | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේනම් ... | 2 50 |
| (ආ) වෙළඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේනම් ... | 1 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් සඳහා හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 4 0 |
| තනි ගොනා බැඳි සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා ... | 2 50 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... ... | 2 50 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ... | 5 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 1 0 |

ඇම්. ඇල්. පෙරේරා,
සභාපති,
කොටිකාවත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
කොටිකාවත්ත—අංගොඩ,
1973 නොවැම්බර් 02 දින.

12-633/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

**කොට්කාවත්ත සුළු නගර සභාව**

1974 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වන අධිකාරය)**

377 වන අධිකාරිය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර කොට්කාවත්ත සුළු නගර සභාවේ බල මණ්ඩලය තුල තබාගෙන සිටින පිරිමි සුනඛයෙක් සඳහා රු. 1 බැගින්ද, ගැහැණු සුනඛයෙක් සඳහා රු. 1.50 බැගින් ද, 1974 මාර්තු 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1974 වර්ෂයට පනවා ඇති බව තත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඇම්. ඇල්. පෙරේරා,
සභාපති,
කොට්කාවත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
කොට්කාවත්ත—අංගොඩ,
1973 නොවැම්බර් මස 02 දින,

12–633/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**කොට්කාවත්ත සුළු නගර සභාව**

1974 වර්ෂයට වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ මෙම ගතවී යන අවුරුද්දට බලපවත්වන පහත සඳහන් වරිපනම් බදු 1974 වර්ෂයට ද, එලෙසම පැනවීමට කොට්කාවත්ත සුළු නගර සභාව තීරණය කර ඇති බව තත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන කුඹුරු හැර අනෙකුත් සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර (4%) බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වෙනිදයින් ජුනි 30 වෙනිදයින්, සැප්තැම්බර් 30 වෙනිදයින් හා දෙසැම්බර් 31 වෙනි දයින් අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකි වේ.

ඇම්. ඇල්. පෙරේරා,
සභාපති,
කොට්කාවත්ත සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 02 දින,
කොට්කාවත්ත සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–633/3—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**ලුණුගල සුළු නගර සභාව**

1974 වර්ෂයේ වරිපනම් ලේඛණ

1974 වර්ෂය සඳහා මෙම නගර සභාවේ වරිපනම් ලේඛණ දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වැනි පරිච්ඡේදය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි පරිච්ඡේදය වන) මහ නගර සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. වී. ඩී. වීරසේකර,
ලුණුගල සුළු නගර සභාවේ සභාපති.

1973 නොවැම්බර් මස 22 වැනි දින,
ලුණුගල සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–72/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**ලුණුගල සුළු නගර සභාව**

1974 වර්ෂයට දේපළ බද්ද

(256 වැනි අධිකාරිය වන) සුළු නගර සභා ආඥා පනතේ 159 වැනි වගන්තිය යටතේ මෙම ගතවී යන වර්ෂයට බල පවත්වන පහත සඳහන් දේපළ බද්ද, 1974 වර්ෂයටද එලෙසම පැනවීමට, ලුණුගල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටා තිබෙන කුඹුරු හැර සියළුම නිශ්චල දේපළ වල වාර්ෂික වටිනාකමින්, සියයට හයක් (6%) බැගින් වූ දේපළ බද්ද, පිළිවෙලින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී සමාන කොටස් හතරකින් ගෙවා අවසාන කළ හැකි වේ.

ඩී. වී. ඩී. වීරසේකර,
සභාපති,
සුළු නගර සභාව, ලුණුගල.

1973 නොවැම්බර් මස 22 වැනි දින,
ලුණුගල සුළු නගර සභා කායර්ාලයේ දීය.

12–72/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**ලුණුගල සුළු නගර සභාව**

1974 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බද්ද

**සුළු නගර සභා ආඥාපනත (256 අධිකාරය)**

ලුණුගල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) සුළු නගර සභා ආඥාපනතේ 161 දරන වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව, 1974 වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා අයකිරීමට ද,

(2) එකී පනතේ අංක 162(3) වැනි වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

ඩී. වී. ඩී. වීරසේකර,
සභාපති,
සුළු නගර සභාව, ලුණුගල.

1973 නොවැම්බර් මස 22 වැනි දින,
ලුණුගල සුළු නගර සභා කායර්ාලයේ දීය.

උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝරථ, පාපැදි හෝ රෝදත්‍රයේ පැපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... | 5 | 0 |
| සෑම පාපැදියක් හෝ රෝදත්‍රයේ පාපැදියක්, හෝ පාපැදි මෝටර් රථයක් හෝ රොදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් : | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 5 | 0 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහාම | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... | 2 | 50 |
| සෑම අත්කරත්තයක් සඳහාම ... ... | 1 | 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙකුට ... | 5 | 0 |
| සෑම බූරුවෙකුට හෝ ගොනෙකුට ... ... | 1 | 0 |

12–72/3—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### දෙහිඕවිට සුළු නගර සභාව

### 1974 වර්ෂය සඳහා දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ ගතවී යන මෙම වර්ෂයට (1973) බල පවත්නා පහත සඳහන් දේපොල වරිපනම් බදු 1974 වර්ෂයටද එලෙසම පැනවීමට දෙහිඕවිට සුළු නගර සභාවේ පාලන නිලධාරී වන මවිසින් තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු හතරකින් ගෙවා නිම කළ යුතුය.

හෙ. පැරකුම් විජේසිංහ,
පාලන නිලධාරි, දෙහිඕවිට සුළුනගර සභාව.

1973 නොවැම්බර් මස 16 වෙනි දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–27/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### දෙහිඕවිට සුළු නගර සභාව

### 1974 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

දෙහිඕවිට සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ :—

(1) සුළුනගර සභා ආඥාපනතේ (256 වන අධිකාරය) 161 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ එම වාහන හා සතුන් ඉදිරියේ සඳහන් කර තිබෙන ගණන් අනුව රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් 1974 වර්ෂයට පනවා ඇති බව හා,

(2) යථෝක්ත ආඥාපනතේ 162(3) වැනි වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්ය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක්, හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් සඳහා ... ... ... | 1 | 0 |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් සඳහා ... | 3 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... | 2 | 50 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... ... | 1 | 0 |
| සෑම රික්ෂෝ රථයක් සඳහා ... ... ... | 3 | 0 |

හෙ. පැරකුම් විජේසිංහ,
පාලන නිලධාරී, දෙහිඕවිට සුළුනගර සභාව.

1973 නොවැම්බර් මස 16 වෙනි දින,
දෙහිඕවිට සුළුනගර සභා කාර්යාලයේ දීය.

12–27/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### දෙහිඕවිට සුළු නගර සභාව

### 1974 වර්ෂයේ වැසිකිළි බාල්දි පවිත්‍ර කිරීමේ ගාස්තු

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ 129(ඩී) වැනි වගන්තිය සහ දෙහිඕවිට සුළු නගර සභාව විසින් පිළිගෙන සම්මත කර ඇති පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පද්ධතියේ 19 වැනි කොටසේ 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දෙහිඕවිට සුළු නගර සභාවේ පාලන නිලධාරි විසින් දෙහිඕවිට සුළු නගර සභා සීමාව තුළ සේවා සලසනු ලබන සෑම වැසිකිළි බාල්දියක් වෙනුවෙන් මසකට රු. 3.00 ක ගාස්තුවක් 1974 වර්ෂයට අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. එකී ගාස්තු ඒ ඒ මාසයේ 10 වෙනි දිනට මත්තෙන් දෙහිඕවිට සුළු නගර සභා කාර්යාලයට ගෙවා නිදහස් විය යුතුය.

හෙ. පැරකුම් විජේසිංහ,
පාලන නිලධාරි, දෙහිඕවිට සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 16 වෙනි දින,
දෙහිඕවිට සුළුනගර සභා කාර්යාලයේ දීය.

12–27/3—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### හික්කඩුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1974 වර්ෂය සඳහා ඒකාබද්ධ දේපල වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 159(1) වැනි වගන්තිය යටතේ, 1973 වර්ෂය සඳහා අයකරනු ලැබූ ප්‍රමාණයන් අනුවම, හික්කඩුව සුළු නගර සභා සීමාවන් තුළ පිහිටා තිබෙන, සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින්, සියයට නවය බැගින්වූ ඒකාබද්ධ වරිපනම් බද්දක්, පිළිවෙළින් 1974, ජූනි 30, සහ දෙසැම්බර් 31 යන දිනයන්හි හෝ ඊට පෙර ගෙවා අවසන් කළ යුතු සමාන කොටස් දෙකකින් යුතුවන පරිදි, හික්කඩුව සුළු නගර සභාව විසින් 1974 වර්ෂය සඳහා ද පනවා ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. ජේ. වීරසේකර,
සභාපති,
හික්කඩුව සුළු නගර සභාව.

1973 නොවැම්බර් 15 වෙනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්යාලය.

12–31/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### හික්කඩුව සුළු නගර සභාව

### 1974 වර්ෂයට සුනඛයින් ලේඛනගත කිරීමේ ගාස්තු

(477 වැනි අධිකාරය වන) සුනඛයින් ලේඛනගත කිරීමේ ආඥා පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර හික්කඩුව සුළු නගර සභාවේ පාලන සීමාව තුළ ඇති කරනු ලබන සෑම බල්ලකු වෙනුවෙන් රු. 1.00 ද, බැල්ලියෙකු වෙනුවෙන් රු. 1.50 ද, 1974 මාර්තු 31 වැනි දා හෝ ඊට පෙර ගෙවිය යුතු වන පරිදි, ලේඛනගත කිරීමේ ගාස්තුවක් 1974 වර්ෂයට පනවා ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. ජේ. වීරසේකර,
සභාපති,
හික්කඩුව සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 15 වෙනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–31/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## හික්කඩුව සුළු නගර සභාව

### 1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපණතේ 161 වැනි වගන්තිය යටතේ පහත උපලේඛනයේ සඳහන් වාහනවලට හා සතුන්ට, ඒ උපලේඛනයෙහි එම වාහන හා සතුන් ඉදිරියෙන් දක්වා ඇති බදු 1974 වර්ෂයට පනවා ඇති බවත්,

එම ආඥාපණතේ 162(3) වැනි වගන්තිය අනුව, එකී බදු 1974 මාර්තු 31 වන දින හෝ එදිනට පෙර හික්කඩුව සුළු නගර සභාවට ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

බී. ජේ. වීරසේකර,
සභාපති,
හික්කඩුව සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 15 වෙනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්යාලය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් රියක් හෝ රෝද තුනේ මෝටර්රියක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත්කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ රෝද තුනේ සයිකලයක් නොවන සෑම රථ වාහනයකටම ... ... | 5 | 0 |
| සෑම බයිසිකලයක්, රෝද තුනේ සයිකලයක්, බයිසිකල් රියක් හෝ කරත්තයක් නැතහොත් රෝද තුනේ සයිකල් රියක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කිරීමේදී ... ... | 5 | 0 |
| (ආ) අන් අන්දමකට පාවිච්චි කිරීමේදී ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බඳින සෑම කරත්තයකටම හෝ තිරික්කලයකටම ... ... ... ... | 4 | 0 |
| තනිගොනා බඳින සෑම කරත්තයකටම හෝ තිරික්කලයකටම ... | 2 | 50 |
| සෑම අත්කරත්තයකටම ... ... ... | 2 | 50 |
| සෑම ජින් රික්ෂෝවකටම ... ... ... | 2 | 50 |
| සෑම අශ්වයකුට, පෝනියකුට හෝ අශ්වතරයෙකුටම ... | 5 | 0 |
| සෑම බූරුවෙක් සඳහා ... ... ... | 1 | 0 |

12–31/3—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## හිඟුරක්ගොඩ සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 වැනි සහ 163 වැනි වගන්ති යටතේ හිඟුරක්ගොඩ සුළු නගර සභාව විසින් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලබන බලපත්‍ර වෙනුවෙන් එහි නිශ්චිතව සඳහන් බලපත්‍ර ගාස්තු 1974 ජනවාරි මස 1 වෙනි දින සිට බලපවත්වන සේ පනවා ඇති බව මෙයින් දනුම් දෙනු ලැබේ.

2. 1972 නොවැම්බර් මස 17 වැනි දින අංක 34 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද බලපත්‍ර ගාස්තු පිළිබඳ නිවේදනය 1974 ජනවාරි මස 1 වන දින සිට මෙයින් අවලංගු කරනු ලැබේ.

ඩී. ආර්. අබේරත්න,
සභාපති,
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 03 වැනි දින,
හිඟුරක්ගොඩ සුළු නගර සභා කායඹාලයේ දීය.

### උපලේඛනය

පහත දක්වෙන කායඹයන් සඳහා යම් භූමිභාගයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීමට බලය ලබා දෙන බලපත්‍රයක් :—

| | බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික ගාස්තුව රු. | ශ. |
|---|---|---|---|
| 1. | බේකරියක් පවත්වාගෙන යාම ... ... | 50 | 0 |
| 2. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම ... | 10 | 0 |
| 3. | බත් කඩයක් පවත්වාගෙන යාම ... ... | 35 | 0 |
| 4. | හෝටලයක් පවත්වාගෙන යාම ... ... | 35 | 0 |
| 5. | මාළු කඩයක් හෝ මාළු විකුණන ස්ථානයක් පවත්වාගන යාම | 50 | 0 |
| 6. | ග්‍රෝස් 1කට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම බෝතල් ගබඩාකර තැබීම ... ... ... | 50 | 0 |
| 7. | ගැලුම් 50කට වැඩිය පොල් තෙල් ගබඩාකර තැබීම ... | 50 | 0 |
| 8. | ගඩොල් හෝ උළු ගබඩා කර තැබීම ... ... | 50 | 0 |
| 9. | කොහු හෝ වෙනත් කෙදි වර්ගවලින් සාදන භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම ... | 20 | 0 |
| 10. | පිදුරු හෝ පොල් අතු ගබඩා කර තැබීම ... ... | 30 | 0 |
| 11. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම ... ... | 25 | 0 |
| 12. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම ... | 50 | 0 |
| 13. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලි ඉරුම් මෝලක් පවත්වාගන යාම ... ... ... | 100 | 0 |
| 14. | දැව ගබඩාවක් පවත්වාගන යාම ... ... | 50 | 0 |
| 15. | දර ගබඩාවක් පවත්වාගන යාම ... ... | 30 | 0 |
| 16. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්මලක් පවත්වාගන යාම | 150 | 0 |
| 17. | යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්මලක් පවත්වාගන යාම ... ... ... | 15 | 0 |
| 18. | හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබාගැනීම ... | 100 | 0 |
| 19. | බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අළුත්වැඩියා කරන වැඩපලක් පවත්වාගන යාම ... .. | 10 | 0 |
| 20. | අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම ... ... ... | 50 | 0 |
| 21. | අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම | 0 | 0 |
| 22. | මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම ... ... | 25 | 0 |
| 23. | මුද්‍රණාලයක් පවත්වාගන යාම ... ... | 50 | 0 |
| 24. | පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම | 100 | 0 |
| 25. | කුකුළන් 100ට වැඩි ගාලක් හෝ කොටුවක් පවත්වාගන යාම | 25 | 0 |
| 26. | බැටළුවන්, එළුවන් හෝ ඌරන් 10කට වැඩි මඩුවක් හෝ ගාලක් පවත්වාගන යාම ... ... | 25 | 0 |
| 27. | තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබාගැනීම ... | 100 | 0 |
| 28. | කරවල, ලූණු මාළු හෝ ජාඩි හොණ්ඩර 3ට වැඩිය ගබඩා කර තැබීම ... ... ... | 30 | 0 |
| 29. | දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබාගැනීම ... | 75 | 0 |
| 30. | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම ... | 75 | 0 |
| 31. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගන යාම ... | 25 | 0 |
| 32. | රසකැවිලි වර්ග නිපදවීම ... ... | 15 | 0 |
| 33. | දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම ... | 25 | 0 |
| 34. | හුණු ගල් හෝ හුණු ගබඩා කර තබාගැනීම ... | 100 | 0 |
| 35. | කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග හෝ කුළු බඩු පිටි ඇඹරීම... | 50 | 0 |
| 36. | ඡායාරූප ශාලාවක් පවත්වාගන යාම ... ... | 30 | 0 |
| 37. | ඩ්‍රයි ක්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගන යාම ... ... ... | 15 | 0 |
| 38. | හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම ... ... ... | 100 | 0 |
| 39. | ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගන යාම ... ... ... | 25 | 0 |
| 40. | බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම ... | 25 | 0 |
| 41. | වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගන යාම ... | 75 | 0 |
| 42. | මෝටර් වාහන සර්විස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගන යාම (යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන) ... | 75 | 0 |
| 43. | මෝටර් රථ අළුත්වැඩියා කිරීමට (යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන) ස්ථානයක් පවත්වාගන යාම ... | 25 | 0 |
| 44. | මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන වැඩපලක් පවත්වාගන යාම ... ... ... | 150 | 0 |
| 45. | බෙලෙක් වැඩපලක් පවත්වාගන යාම ... ... | 50 | 0 |
| 46. | පැට්‍රල්, ඩීසල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කිරීම ... ... ... | 250 | 0 |
| 47. | පැට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගන යාම ... | 250 | 0 |
| 48. | කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම ... | 25 | 0 |
| 49. | විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන හෝ නිපදවන වැඩපලක් පවත්වාගන යාම | 25 | 0 |
| 50. | බාබර් සාප්පුවක් පවත්වාගන යාම ... ... | 25 | 0 |
| 51. | ලැගුම් හලක් පවත්වාගන යාම ... ... | 50 | 0 |
| 52. | මස් ඩකයක් හෝ මස් වෙළඳ ස්ථානයක් තබාගැනීම ... | 25 | 0 |
| 53. | යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග කෙටීම— | | |
| | අශ්ව බල 10 හෝ ඊට අඩු ... ... | 50 | 0 |
| | අශ්ව බල 11–20 දක්වා ... ... | 100 | 0 |
| | අශ්ව බල 21 හෝ ඊට වැඩි ... ... | 250 | 0 |
| 54. | විකිණීම සඳහා මිණී පෙට්ටි තබාගැනීම ... ... | 100 | 0 |
| 55. | අයිස් ක්‍රීම් සෑදීම ... ... ... | 25 | 0 |
| 56. | ගඩොල් හෝ උළු පිළිස්සීම— | | |
| | පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ... ... | 10 | 0 |
| | වෙළඳාම සඳහා ... ... ... | 50 | 0 |
| 57. | හාල් සිල්ලර බඩු කඩයක් පවත්වාගන යාම ... | 25 | 0 |
| 58. | දුම්කොළ හෝ සුරුට්ටු විකිණීම සඳහා ගබඩා කිරීම ... | 25 | 0 |
| 59. | සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගන යාම ... | 25 | 0 |

12–59/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## හිඟුරක්ගොඩ සුළු නගර සභාව

### 1974 වර්ෂය සඳහා වැසිකිළි හා කසළ ගාස්තු

**256** වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ **152** හා **156** වෙනි වගන්ති යටතේ හිඟුරක්ගොඩ සුළු නගර සභා සීමාව තුළ වැසිකිළි ශෝධනය කෙරෙන සෑම වැසිකිළි බාල්දියක් සඳහා මසකට රු. 2ක ගාස්තුවක් සහ කසළ ඉවත් කිරීමේ සේවය කෙරෙන ප්‍රදේශයේ එක් ස්ථානයකට ශත 50ක ගාස්තුවක් 1974 වර්ෂයට පනවා අය කිරීමටද, එම ගාස්තු 1973 වර්ෂයේ බලපැවැත්වූ ගාස්තුවලට සමාන බැවිද හිඟුරක්ගොඩ සුළු නගර සභාව තීරණය කර ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩී. ආර්. අබේරත්න,
සභාපති,
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 03 වැනි දින,
හිඟුරක්ගොඩ සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–59/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## හිඟුරක්ගොඩ සුළු නගර සභාව

### 1974 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත වන 256 වන අධිකාරය යටතේ ගතවී යන **1973** වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු **1974** වර්ෂයටද එලෙසම පැනවීමට හිඟුරක්ගොඩ සුළු නගර සභාව තීරණය කර ඇති බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**159** වන වගන්තියේ ප්‍රකාර හිඟුරක්ගොඩ සුළු නගර සීමාව තුළ පිහිටා තිබෙන වී ගොවිතැන් කරන කුඹුරු හැර, සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වාර්ෂික බදු, පිළිවෙලින් මාර්තු 31 වනදයින්, ජූනි 30 වනදයින්, සැප්තැම්බර් 30 වනදයින් සහ දෙසැම්බර් 31 වනදයින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

ඩී. ආර්. අබේරත්න,
සභාපති,
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 03 වැනි දින,
හිඟුරක්ගොඩ සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–59/3—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## හිඟුරක්ගොඩ සුළු නගර සභාව

### 1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

**256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත**

හිඟුරක්ගොඩ සුළු නගර සභාට—

(1) 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය අනුව, පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1974 වර්ෂයට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා ඇති බවත් ;

(2) එකී ආඥාපනතේ 162(3) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර් එකක්, රෝද තුනේ කාර් එකක්, ලොරියක්, මෝටර් සයිකල් එකක්, කරත්තයක්, අත් කරත්තයක්, ජින් රික්ෂෝ රථයක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හැර වෙන ඕනෑම අන්දමක සෑම වාහනයකටම ... ... | 4 | 0 |
| සෑම බයිසිකලයකට, ට්‍රයිසිකලයකට, බයිසිකල් කාර් එකකට හෝ කරත්තයකට හෝ ට්‍රයිසිකල් කාර් එකකට හෝ කරත්තයකට— | | |
| (අ) වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන විට ... | 2 | 50 |
| (ආ) වෙළඳ නොවන වෙනත් කටයුතු සඳහා පාවිච්චි කරන විට | 1 | 0 |
| සෑම ගොන් දෙන්නා බඳින කරත්තයකට ... ... | 4 | 0 |
| සෑම තනි ගොන බඳින කරත්තයකට ... ... | 2 | 50 |
| සෑම අන් කරත්තයකට ... ... ... | 1 | 50 |

ඩී. ආර්. අබේරත්න,
සභාපති,
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 03 වැනි දින,
හිඟුරක්ගොඩ සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–59/4—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## හිඟුරක්ගොඩ සුළු නගර සභාව

### 1974 වර්ෂය සඳහා සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත වන 477 වන අධිකාරයේ 4 කොටසේ ප්‍රකාර හිඟුරක්ගොඩ සුළු නගර සභා සීමාව තුළ තබාගන්නා සෑම බල්ලෙකුට රු. 1 ක් හා සෑම බැල්ලියකට රු. 2 ක් බැගින්, 1974 වර්ෂයට ලියාපදිංචි කිරීමේ ගාස්තු පනවා ඇති බවත් එකී ගාස්තු 1974 මාර්තු 31 වෙනිද හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ආර්. අබේරත්න,
සභාපති,
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 03 වැනි දින,
හිඟුරක්ගොඩ සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–59/5—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## රඹුක්කන නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම සඳහන් අය එහි සඳහන් කොට ඇති ස්ථානවල 1974 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වැනි පරිච්ඡේදයේ) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන රඹුක්කන නගර සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට 14 දිනක් ඇතුළතදී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|---|
| 1. | ඇස්. නදීර්, 14, දුම්රියපොල පාර, රඹුක්කන ... | ... රඹුක්කන පොදු වෙළඳ පොලේ අංක 24 දරණ එළු මස් කඩය |

ඩබ්ලිව්. ඩී. සෝමතුංග,
රඹුක්කන නගරයේ විශේෂ කොමසාරිස්.

1973 නොවැම්බර් මස 24 වැනි දින,
රඹුක්කන විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

12–209—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

**4.** එක් එක් පහන් අල්ලුවක් වෙනුවෙන් වොට් 25කට නොඅඩු පහන් බැර තක්සේරුවකට අවශ්‍යතා ගාස්තු උපලේඛනය යටත් වනු ඇත.

**5.** සීයන් පංකා බැර තක්සේරු කළ යුත්තේ එකකට වොට් 50 බැගින්.

**ගාස්තු අංක 7 (තාවකාලික ආලෝක කිරීම් සඳහා)**

1. දැනට පවත්නා මනුවට අතිරේක අවශ්‍යතාව දැරිය හැකි නම් දැනට සිටින පාරිභෝගිකයන්ගෙන් ඔවුනට නියමිත ගාස්තු ක්‍රම අනුව විදුලි බල ගාස්තු අයකරනු ලැබේ.

(අ) දැනට පවත්නා මනුවක් මගින් විදුලි බලය සපයන විට විදුලිබල ගාස්තුවට අතිරේකව රුපියල් 5ක ගාස්තුවක් අයකරනු ලැබේ.

(ආ) විශේෂ මනුවක් මගින් විදුලි බලය සපයන විට අංක 1 දරණ පොදු ගාස්තු ක්‍රමයට අතිරේකව රුපියල් 10ක ගාස්තුවක් අය කරනු ලැබේ. මෙම ගාස්තු ක්‍රමය ප්‍රසිද්ධ සිද්ධස්ථානවලට අදාල නොවන්නේය.

2. තාවකාලික පාරිභෝගිකයන්ගෙන් අංක 1 දරණ පොදු ගාස්තු ක්‍රමය යටතේ විදුලිබල ගාස්තු අය කරනු ලැබේ. ඊට අතිරේකව මනු සහ සේවා ගාස්තු අය කරනු ලැබේ.

**ගාස්තු අංක 8 (ප්‍රසිද්ධ සිද්ධස්ථාන සඳහා)**

මෙම ගාස්තු ක්‍රමය මහජනයා වැඳුම් පිදුම් කරන ස්ථානයක් ඇතුළත පිහිටියාවූත් වැඳුම් පිදුම් කරන ස්ථානයේ පූජකවරුන් පදිංචිව සිටින්නාවූත් නේවාසිකාගාර ඇතුළු ප්‍රසිද්ධ සිද්ධස්ථානවල භාවිතා කෙරෙන විදුලිය සැපයීම වෙනුවෙන් අදල වන්නේ ය.

ඒකකයක් ශත 20 බැගින්. මනු කුලිය රු. 1 යි.

**විවිධ ගාස්තු**

1. ස්ථාපන පරීක්ෂා කිරීම :

(අ) නව ස්ථාපන සහ පවත්නා ස්ථාපන විශාල කිරීම් පළමුවරට පරීක්ෂා කිරීම් නොමිලයේ.

(ආ) පළමුව පරීක්ෂණය අසතුටුදයක නම් එක් එක් අතිරේක පරීක්ෂණයක් සඳහා—

| | | |
|---|---|---|
| සම්පූර්ණ ස්ථාපන | රු. | 10 යි. |
| විශාල කිරීම් | රු. | 5 යි. |

2. මනු පරීක්ෂා කිරීම :

පාරිභෝගිකයාගේ අයදුම් මත අනුව පරීක්ෂා කිරීමට රු. 5/-යි. මනුවේ දෝෂය සියයට 2 1/2කට අඩු හෝ වැඩි නම් ගාස්තුව ආපසු දෙනු ලැබේ.

3. නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු :

(අ) මුදල් නොගෙවීම මත විසම්බන්ධ කරනු ලැබූ සැපයුම නැවත සම්බන්ධ කිරීම රු. 10 යි.

(ආ) නියෝග කඩ කිරීම මත විසම්බන්ධ කරනු ලැබූ සැපයීම නැවතත් සම්බන්ධ කිරීමට රු. 15 යි.

(ඇ) පැය 48කට අඩු කාලයකින් දැනුම් දුන්විට විශේෂ නැවත සම්බන්ධ කිරීමේ ගාස්තුව රු. 2 යි.

4. සැපයුම් බිඳ වැටීම:

විලායක කරුවන්ගේ සේවය සඳහා ගාස්තුව රු. 2 යි.

**සටහන්**

1. ගාස්තු ක්‍රම අංක. 5 සහ 6.—මුළු පරිහරණ ප්‍රමාණයටම, අදල ගාස්තු ක්‍රමය යටතේ මුදල් අය කෙරෙනු ඇත. එසේ නැතහොත් පාරිභෝගිකයාගේ කැමැත්ත පරිදි පහන්, පංකා, ශීතකරණ සහ අධිශීතකරණ සඳහා අංක 1 දරණ ගාස්තු ක්‍රමය යටතේ ද ගාමක බලය සඳහා සහ විද්‍යුත් රසායනික නැතහොත් විද්‍යුත් තාප ක්‍රියා අංක. 2 දරණ ගාස්තු ක්‍රමය යටතේ ද මුදල් අයකෙරෙනු ඇත.

අංක 4 දරණ ගෘහීය ගාස්තු ක්‍රමයේ 4 වැනි ඡේදය යටතේ වෘත්තීය හෝ වෙළඳ බැර තක්සේරු කිරීමේ දී ස්ථාවර ගාස්තුව ප්‍රමාණුකූල ක්‍රමයකට කිට්ටුම ඊළඟ සම්පූර්ණ රුපියලට නිශ්චය කෙරෙනු ඇත. මෙහි දී අංක 6 දරණ ගාස්තු ක්‍රමයේ 2 වැනි ඡේදය යටතේ අඩුම ගාස්තුව අදල නොවන්නේය.

මසකින් කොටසකට සැපයුම සඳහා ස්ථාවර ගාස්තුව, අඩුම ගාස්තුව හා මනු කුළිය ප්‍රමාණුකූල ක්‍රමයකට ගණන් ගනු ඇත.

උපරිම අවශ්‍යතා කි. වෝ. ඇ. වනුයේ මිනිත්තු 15ක කාලයක් තුල ප්‍රකාශිත වෝල්ටියතාව අනුව ගිණූ විදුලි බල ප්‍රමාණය වේ.

| | | |
|---|---|---|
| ගාමක බලය | = | Motive power |
| විද්‍යුත් රසායනික | = | Electro Chemical |
| විද්‍යුත් තාප | = | Electro Thermal |
| නිර්ණිත අවශ්‍යතාව | = | Assessed Demand |
| අවශ්‍යතා ගාස්තුව | = | Demand Charge |
| උපරිම අවශ්‍යතා ගාස්තුව | = | Maximum Demand Charge |
| මනුව | = | Meter |
| ස්ථාපන | = | Installations |
| විලායකකරුවන් | = | Fusemen |
| ප්‍රමාණුකූල | = | Pro Rata basis |
| සීයන් පංකා | = | Ceiling Fans |

12—108—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**අලව්ව සුළු නගර සභාව**

**1974 වර්ෂය සඳහා වරිපනම් බද්ද පැනවීම**

(256 වන අධිකාරිය වන) සුලු නගර සභා ආඥාපණත යටතේ, ගතවී යන මෙම වර්ෂයට බල පවත්නා පහත සඳහන් බදු 1974 වර්ෂයට ද එලෙසම පැනවීමට අලව්ව සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපල වල (කුඹුරු හැර) වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වාර්ෂික බද්දක් පිළිවෙලින්, මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

එච්. ඇම්. කුමාරදාස,
සභාපති,
අලව්ව සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 24 වන දින,
අලව්ව සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–163/1—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**අලව්ව සුළු නගර සභාව**

**1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

256 වන අධිකාරිය වන සුළු නගර සභා ආඥාපණතේ අංක 161 දරණ වගන්තිය යටතේ, පහත සඳහන් උප ලේඛණයෙහි විස්තර වන ගණන් අනුව 1974 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපණතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

**උපලේඛනය**

| | රු. | ශ. |
|---|---|---|
| (1) මෝටර් කාර්, රෝද තුනේ මෝටර් කාර්, ලොරි, මෝටර් පැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝද තුනේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | 5 | 0 |
| (2) සෑම පාපැදියක්, රෝද තුනේ පාපැදියක්, මෝටර් පැදියක්, කරත්තයක්, රෝද තුනේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා ... | 1 | 0 |
| (3) ඕනෑම අන්දමේ ගොන් දෙන්නා බැඳි කරත්තයක් සඳහා ... | 4 | 0 |
| (4) තනි ගොනා බඳින සෑම බර බාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 2 | 50 |
| (5) සෑම අත් කරත්තයක් සඳහා ... ... | 4 | 0 |
| (6) සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| (7) සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්ව තරයෙක් සඳහා ... | 5 | 0 |
| (8) සෑම අලියෙක් සඳහා ... ... ... | 10 | 0 |
| (9) සෑම බූරුවෙක් සඳහා ... ... ... | 1 | 0 |

එච්. ඇම්. කුමාරදාස,
සභාපති,
අලව්ව සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 24 වන දින,
අලව්ව සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–163/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### අලව්ව සුළු නගර සභාව

**1974 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම**

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපණතේ 161 වන සහ 163 වන වගන්ති යටතේ අලව්ව සුළු නගර සභාව විසින් 1971.3.12 වන දින අංක 14,949 දරණ ගැසට් පත්‍රයෙහි හා 1973.01.05 දින අංක 41 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශිත පරිදි මෙතෙක් පනවා තිබූ බලපත්‍ර ගාස්තු 1974 වර්ෂයේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එලෙසම පනවන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඇම්. කුමාරදාස,
සභාපති,
අලව්ව සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 24 වන දින,
අලව්ව සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–163/3—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ දිස්ත්‍රික්කයේ දඹුගම්පේරුව ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව, දඹුගම්පේරුව ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට ඒ සඳහා තමා විරුද්ධ වන්නේ අසවල් කාරණා නිසාදැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|
| ඇන්. ඒ. කුරේ මහතා, "අබේසිරි", බටගම උතුර, ජාඇල ... | ... මාඑළිය ... | ... එළ හරක් මස් |

ඩී. ඩී. එච්. සූරියආරච්චි,
පරිපාලන නිලධාරි,
දඹුගම්පෙරුව ගම්සභාව.

1973 නොවැම්බර් මස 21 වැනි දින,
දඹුගම්පේරුව ගම්සභා කාර්යාලයේ දී ය.

12–98—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයේ දක්වෙන අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1974 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභා සීමාව තුළ ස්ථිර පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දිනයේ සිට දින 14ක් ඇතුළත ලියා මා වෙත ඉදිරිපත් කළ යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

බී. ජී. ගෝවින්දපාල,
පාලන නිලධාරි,
කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාව

1973 නොවැම්බර් මස 22 වැනි දින,
කිරිඇල්ලේ පිහිටි ගම්සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඇස්. අල්. ඇම්. සදකත් මයා., බමුණුමුල්ල–අටුලුගම, බණ්ඩාරගම ... | කිරිඇල්ල, ඉඩන්ගොඩ පොදු වෙළඳසැලේ අංක 7 දරණ කඩ කාමරය | ගව මස් |

12–19—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ මොරගොල්ලාගම ගම් සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයේ 1974 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ මොරගොල්ලාගම ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටින සේ සකස්කොට මෙම දැන්වීම් ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බැව් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇස්. මොහම්මදු ලෙබ්බේ, නෑගම, නෑගම්පහ ... | ... මස් පිණිස සතුන් මරා විකිණීම ... | කේ. බී. රාජපක්ෂ මහතාගේ ඉඩම, මොරගොල්ලාගම |

මිත්‍රරත්න දසනායක,
මොරගොල්ලාගම ගම් සභාවේ සභාපති.

1973 නොවැම්බර් මස 19 වැනි දින,
ගම්සභා කාර්යාලය, මොරගොල්ලාගම.

12–51—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ගම්සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයන්හි 1974 මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස බලපත්‍රයක් ඉල්ලා අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7 (2) වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන ඉබ්බාගමුව ගම්සභා ප්‍රදේශ සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

එච්. ඇම්. එච්. බණ්ඩා,
ඉබ්බාගමුව ගම් සභාවේ පාලන නිළධාරි යහ
කුරුණෑගල සහකාර පලාත් පාලන කොමසාරිස්.

1973 නොවැම්බර් මස 20 වැනි දින,
ඉබ්බාගමුව ගම්සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඩබ්ලිව්. පී. සැන්ඩි, රඹුකන්දන, මොරතිහ ... | ... එළ හරක් මස් ... | ... මඩිගේමුදුන්දුව–මාරගහමුලවත්ත |
| 2. යූ. ඇම්. සහීඩ්, බක්මීගොල්ල, ඉබ්බාගමුව ... | ... එළ හරක් මස් ... | ... බක්මීගොල්ල–පල්ලියගහවත්ත |

12–154—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**මැදගම්පත්තු ගම් ප්‍රදේශය—මොණරාගල දිස්ත්‍රික්කය**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් කර තිබෙන ස්ථානයේ 1974 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා ඉල්ලුම් පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන මැදගම්පත්තු ගම් ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඈ එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. එම්. අයි. ජෙමීල් ... | ... මැදගම ... | ... මැදගම ... | ... ගව මස් |
| 2. එම්. අයි. හසන් ... | ... කොටබෝව ... | ... කොටබෝව | ... ගව මස් |
| 3. එම්. අයි. සමදූදීන් ... | ... බකිණිගහවෙල ... | ... බකිණිගහවෙල | ... ගව මස් |

පරිපාලන නිලධාරි,
මැදගම්පත්තු ගම්ප්‍රදේශය, මැදගම.

1973 නොවැම්බර් මස 23 වැනි දින,
පරිපාලන නිලධාරි කාර්යාලයේ දී ය.

12–179—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල ගම් සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව දිඹුල ගම්සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට, ඒ සඳහා තමා විරුද්ධ වන්නේ අසවල් කාරණා නිසායැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව, මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ වගන්තියේ 2 (ඒ) සහ (බී) උප වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

**උපලේඛනය**

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳුමෙහි ස්වභාවය |
|---|---|---|
| 1. එස්. සේගුඋදුමාන් මයා., ඩයගම, ආගරපතන ... ... | ... ඩයගම, ආගරපතන | ... හරක් මස් කඩය |
| 2. එස්. සේගුඋදුමාන් මයා., හෝල්බෲක්, ආගරපතන ... | ... හෝල්බෲක්, ආගරපතන | ... හරක් මස් කඩය |
| 3. එස්. ඒ. අබ්දුල් කරීම් මයා., හෝල්බෲක්, ආගරපතන ... | ... හෝල්බෲක්, ආගරපතන | ... එලු මස් කඩය |
| 4. බී. එස්. එම්. සුලෙයිමාන් මයා., ග්ලෙන්ලයින්, ආගරපතන ... | ... ග්ලෙන්ලයින්, ආගරපතන | ... හරක් මස් කඩය |
| 5. ඒ. මොහමඩ් මයා., දියනිල්ලකැලේ, ලිඳුල ... ... | ... දියනිල්ලකැලේ, ලිඳුල | ... හරක් මස් කඩය |
| 6. බී. එස්. එම්. ඒ. කාදර් මයා., මෙරායා කඩවීදිය, ලිඳුල ... | ... මෙරායා කඩවීදිය, ලිඳුල | ... හරක් මස් කඩය |

කේ. ජී. අමරියස් අප්පුහාමි,
දිඹුල ගම් සභාවේ සභාපති තැන.

1973 නොවැම්බර් මස 26 වැනි දින,
කොටගල දිඹුල ගම්සභා කාර්යාලයේ දී ය.

12–237—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### යටිනුවර මැද පලාත ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය ඊට ඉදිරියේ සඳහන් ස්ථානයෙහි 1974 වර්ෂය සඳහා එළහරක් මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍ර අයදුම්කොට ඇත. එම බලපත්‍ර නිකුත් කිරීම ගැන යටිනුවර මැද පලාත ගම් ප්‍රදේශය තුළ පදිංචි යම් කිසිවෙකු විරුද්ධ වන්නේ නම්, ඒ බව කරුණු සහිතව පිටපත් දෙකකින් යුත් ලිඛිත ප්‍රකාශනයෙකින් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවූ දිනයේ සිට සති දෙකක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272) අධිකාරියේ 7 වන වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| අබ්දුල් කාදර් අබ්දුල් කපූර් ... | පිලපිටිය, කිරිබත්කුඹුර ... | මුංවතුගොඩ, කන්දෙකුඹුර නම් ඉඩම ... | එළහරක් මස් කඩයක් |

ජී. ලේන්සුවා,
සභාපති,
යටිනුවර මැද පලාත ගම් සභාව.

1973 නොවැම්බර් මස 28 වැනි දින,
යටිනුවර මැද පලාත ගම්සභා කායසීාලය,
ඇඹිල්මීගම, පිළිමතලාව.

12–256—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ගඟඉහළ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1974 වර්ෂයට මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස බලපත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන උඩ පළාත ගඟඉහළ ගම් සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමණ හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත දී මා වෙත එවිය යුතු බවට මෙයින් දනුම් දෙමි.

ඇම්. ඇස් අලුත්ගමගේ,
සභාපති,
ගඟඉහළ ගම් සභාව.

1973 නොවැම්බර් මස 21 වැනි දින,
උඩපළාත ගඟඉහළ ගමසභා කාර්යාලය,
ගල්පාය, මීතලාව.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇස්. ඇම්. නිෂාම් ... ... ... ... | හරක් මස් ... ... | අංක 215, උලපනේ |

12–29—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලෙගම්පහ උතුර ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයන්හි 1974 වර්ෂයට එළ ගව මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම පිණිස බලපත්‍ර ඉල්ලා ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේගම්පහ උතුර ගම් සභා ප්‍රදේශයේ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලක පටපත් දෙකකින් යුක්තව සිටින සේ සකස් කොට මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7 වන වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇන්. ඇල්. ඒ. ලතීෆ්, 283, මඩවල බසාර්, මඩවල ... ... | එළ ගව මස් .. | අංක 53, උන්ටිල |
| 2. | ඇම්. ඉනාම්දීන්, උඩතලවින්න මඩිගේ, කටුගස්තොට ... ... | එළ ගව මස් .. | පොල්ගහමුළ වත්ත, උඩතලවින්න මඩිගේ |
| 3. | ඇම්. ඇස්. කේ. දලිඋනුමාන්, අංක 70, උඩතලවින්න මඩිගේ, කටුගස්තොට ... | එළ ගව මස් | ...ගලහිටවාපු තැන්න වත්ත, උඩතලවින්න මඩිගේ |
| 4. | කේ. නාගූර්පිච්චේ, රෝටුකඩේ, මඩොල්කැලේ ... ... | එළ ගව මස් | ...ගල්ගොඩහේන, රෝටුකඩේ, මඩොල්කැලේ |
| 5. | යූ. එල්. අබ්දුල් හසන්, අංක 18, හසන් ඇවනිව්, මාතලේ ... ... | එළ ගව මස් .. | හුලුගඟ පොදු වෙළඳ පොළ |
| 6. | ඇම්. වහබ්දීන්, 94, වත්තේගෙදර, පොල්ගොල්ල ... ... | එළ ගව මස්... | කිතුලෙ ගහමුදුනෙ වත්ත, වත්තේගෙදර |

එච්. ඇම්. බී. උඩුරාවන,
සභාපති,
පාතදුම්බර පල්ලේගම්පහ උතුර ගම් සභාව.

1973 නොවැම්බර් මස 23 වන දින,
වත්තේගම, වාවින්න,
ගම් සභා කාර්යාලයේදීය.

12–55—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ උතුර ගම් සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ උතුර ගම් සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මගින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (257 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| 1. ඒ. ඇම්. හලීම් මහතා, මඩවල බසාර් | එළ හරක් මස් | මඩවල අංක 1 මස් කඩය |
| 2. ඒ. එච්. එම්. පායිස් මහතා, මඩවල බසාර් | එළ හරක් මස් | මඩවල, අංක 2 මස් කඩය |
| 3. ඒ. ඇම්. සෙයිනුල් ආබදීන් මහතා, මඩවල බසාර් | එළ හරක් මස් | මඩවල, අංක 3 මස් කඩය |
| 4. මඩිගේ එම්. එච්. මසූඩ් මහතා, මඩවල, මඩිගේ | එළ හරක් මස් | මඩවල, අංක 4 මස් කඩය |
| 5. මඩවල මුස්තාපා හසන් මහතා, මඩවල, මඩිගේ | එළ හරක් මස් | මැණික්හින්න, අංක 1 මස් කඩය |
| 6. ඒ. එම්. රිසාක් මහතා, මඩවල, බසාර් | එළ හරක් මස් | මැණික්හින්න, අංක 2 මස් කඩය |

යූ. පී. වයි. ජිනදාස,
සභාපති,
පාතදුම්බර උඩගම්පහ උතුර ගම්සභාව.

1973 නොවැම්බර් මස 20 වැනි දින,
ගම්සභා කාර්යාලය,
නාපාන, මැණික්හින්න.

12-94—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිත XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වන දින සිට ගාල්ල දිස්ත්‍රික්කයේ පිලාන-මැටරඹ ගම් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත්, 1973 නොවැම්බර් මස 22 වැනි දින අංක 84 දරණ තීරණයෙන් මම සම්මත කරමි.

ඩබ්ලිව්. කේ. ජී. පී. පී. අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස් (ගාල්ල),
පිලාන-මැටරඹ ගම් සභාව.

1973 නොවැම්බර් මස 22 වැනි දින,
උණවටුන, මැටරඹ,
පිලාන-මැටරඹ ගම් සභා කාර්‍යාලයේ දීය.

අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදිවූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වන කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථාව පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

1. එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථා ආදේශ කිරීමෙන් :

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහිවූ උපලේඛනයෙහි අවසානවෝවීතවූ පරිදි I වැනි කොටසේ හෝ II වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ ".

තවද,

2. එම කොටසෙහි අවසානයට පහත දක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :

උපලේඛනය

I වැනි කොටස—අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළු ගල් කැනීම
කබොක්, බොරළු හෝ කළු ගල් ගබඩා කිරීම
සිසිල් බීම නිෂ්පාදනය
ග්‍රොස් එකට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබාගැනීම
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිස්සාරණය කිරීම
ගැලුම් පනහට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබාගැනීම
පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් දෙළහට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
ගිනි පෙට්ටි නිෂ්පාදනය
ග්‍රොස් දහයට වැඩි ප්‍රමාණයක ගිනි පෙට්ටි ගබඩා කර තබාගැනීම
ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් ගබඩා කර තබාගැනීම
මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබාගැනීම
ගඩොල් හෝ උළු හෝ ගබඩා කර තබාගැනීම
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි හෝ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබාගැනීම
කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබාගැනීම
පිදුරු ගබඩා කර තබාගැනීම
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබාගැනීම
කුලියට දීමට ලාම්පු ගබඩා කර තබාගැනීම
ධාන්‍ය හෝ මාෂ බෝග හොන්ඩර පහට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
අතින් ලී ඉරන ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
දුව ගබඩාවක් පවත්වාගෙන යාම
දර ගබඩාවක් පවත්වාගෙන යාම
හිරිගල් හෝ හුණු ගල් සඳහා හැරීම
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යාම
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, හුණු හෝ සීනි හොන්ඩර පහළොවට වැඩියෙන් ගබඩා කර තබාගැනීම
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබාගැනීම
බයිසිකල් හෝ මෝටර් බයිසිකල් හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පොලක් පවත්වාගෙන යාම
අළුත් හෝ පාවිච්චි කරන ලද හෝ ටයර් හෝ ටියුබ් පනහකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම
පොල් කටු ගබඩා කර තබාගැනීම
ගෝන්දගම් හෝ ගෝන්දගම් කුඩු හොන්ඩර එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි ගබඩා කර තබාගැනීම
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ වියීම
අත් යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම
සිල්ක් හෝ කෘත්‍රිම රෙදි වියීම හා විසිතුරු කිරීම
මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම

II වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබාගැනීම
පොර හෝ රසායනික පොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබාගැනීම
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
හම් ගබඩා කර තබාගැනීම
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොන්ඩර පහකට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබාගැනීම
කුකුළන් සියයකට වැඩි ගණනක් සඳහා කුකුළ් ගාලක් හෝ කුකුළ් කොටුවක් හෝ පවත්වාගෙන යාම
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබාගැනීම
පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යාම
පුවක් සකස් කිරීම හෝ ගබඩාකර තබාගැනීම

තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුලු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබාගැනීම
කරවල, ලුණු මාළු හෝ ජාඩි හොන්ඩර තුනකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම
මාළු හෝ මස් හෝ ජාඩි දැමීම, වේලීම හෝ අයිස් දැමීම
අඟුරු සඳහා දව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබාගැනීම
සිමෙන්ති හොන්ඩර විසිපහකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබාගැනීම
සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම
පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම
සත්ව ආහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම
සබන් නිෂ්පාදනය කිරීම
සව් හෝ මංඤොක්කා කැටි " ටැපියෝකා " නිපදවීම
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
ට්‍රන්ක් පෙට්ටි සෑදීම
අළුත් හෝ පරණ හෝ ලෝහ ගබඩා කර තබාගැනීම
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම
මෙරට හෝ රට වේවැල්වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබාගැනීම
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප හෝ ගබඩා කර තබාගැනීම
සිරප් හෝ පලතුරු බීම වර්ග සෑදීම
රසකැවිලි වර්ග නිපදවීම
පොල් ලෙලි හෝ දව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම
මේද නිපදවීම හෝ නිශ්කරණය කිරීම
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම
දත් බුරුසු නිපදවීම
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
විනාකිරි එකතු කිරීම හෝ ගබඩා කිරීම
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම
හුණු ගල් හෝ හුණු හෝ ගබඩා කර තබාගැනීම
පැණි නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොන්ඩර 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම
කෝඩා නිපදවීම
කෙඳි සායම් කිරීම
කොකෝවා හෝ වියළි පැපොල් කිරි හෝ ගබඩා කර තබාගැනීම
සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
පලතුරු, මාළු වර්ග හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම
කෝපි, ධාන්‍ය වර්ග, මාෂ බෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම
බේකිං පවුඩර් නිපදවීම
මාජරින් නිපදවීම
ගෑස් මැන්ටල් නිපදවීම
පොටි නිපදවීම
ඉටිපන්දම් නිපදවීම
කපුරු නිපදවීම
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
රෙදි සෝදන නිල් නිපදවීම
සායම් කුඩු නිපදවීම
ලාකඩ නිපදවීම
සුවඳ පුයර නිපදවීම
පාසැල් රට හුණු නිපදවීම
ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
වැලි කඩදාසි නිපදවීම
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම
පාසැල් ගල්ලෑලි නිපදවීම
සෞඛ්‍ය තුවාකඩ නිපදවීම
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
සෙල්ලම් බඩු නිපදවීම
මුදු පාසි සකස් කිරීම හෝ ගබඩා කර තබාගැනීම
සීත කළ මස් හෝ මාළු හෝ ගබඩා කර තබාගැනීම
පලාපු පොල් නිපදවීම
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
මැණික් ගල් කැපීම හා ඔප දැමීම
දිය හුණු, සුදු ටයිට්ං හුණු හෝ හිරිගල් නිපදවීම
එන්සහල් "කරදමුංගු" සකස් කිරීම හෝ වේලීම

### III වැනි කොටය—අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මීනිරන් ශුද්ධ කිරීම
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, එන්සහල් "කරදමුංගු" හෝ කෙඳි වර්ග සකස් කිරීම.
ඩ්‍රයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.
රෙදි මුද්‍රණ කවන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.
විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
තෙල් හෝ සත්ව මේද සැපයීම.
හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම.
මැටි බඳුන් ඔප දැමීම.
ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝර වරල් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
හොන්ඩර තුනකට වැඩියෙන් තේ ගබඩා කර තබාගැනීම
බැටරි චාර්ජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම
වෑල්ඩිං වැඩ සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපොලක් පවත්වාගෙන යාම
බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම
වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
ගල් ස්මාරක නිපදවීම
පැට්‍රල්, ඩීසල් තෙල්, හෝ වෙන යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
පැට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
මෝටර් වාහන සඳහා බොඩි නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම
පොලිස් හෝ ඉටි වර්ග නිපදවීම
කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම
විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම
මදුරු කව " කොයිල්ස් " නිපදවීම
ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම
රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම
ගල් තාර හෝ වෙනත් බිටුමත්මය නිෂ්පාදනය කිරීම
වීදුරු භාණ්ඩ නිපදවීම
වීදුරු කැඩපත් නිපදවීම
යකඩ තහඩු ගැලවනයිස් කිරීම
පාස්සන ඊයම් නිපදවීම
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම
කටුකම්බි නිපදවීම
කම්බි ඇණ නිපදවීම
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි " රිබන් " නිපදවීම
බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම
ජී.අයි. බාල්දි නිපදවීම
වායු සමීකරණ යන්ත්‍ර, සීතකරණ හෝ අධි සීතකරණ " ඩීප් ෆ්‍රීසර් " නිපදවීම
බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම
යන්ත්‍රෝපකරණ නිපදවීම
විදුලි භාණ්ඩ නිපදවීම
රබර් කැවුනු කෙඳි වර්ග නිපදවීම
සංවායන බැටරි නිපදවීම
වියළි කෝෂ බැටරි නිපදවීම
ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
යම් යම් සුන්බුන්වලින් ලෝහ නිෂ්කරණය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
ට්‍රැක්ටර් රථ එකලස් කිරීම
රේඩියේටර් නිපදවීම
විදුලි කර්මාන්ත වැඩපොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා වැඩපොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපොලක් පවත්වාගෙන යාම

12–100—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### අග්බෝපුර ගම්සභාව—ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අයවලුන් විසින් එහි සඳහන් ස්ථානයන්හි 1974 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරයේ) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන අග්බෝපුර ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වනුයේ කුමන හේතුව නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම්දෙමි.

පී. එල්. සිරිසේන,
අග්බෝපුර ගම්සභාවේ සභාපති.

1973 නොවැම්බර් මස 26 වැනි දින,
අග්බෝපුර ගම්සභා කාර්යාලයේදීය.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. බී. අබ්දුල් බසීර්, යුනිට් 22, මුස්ලිම් ජනපදය, අග්බෝපුර ... ... | එළ හරක් මස් ... | මුස්ලිම් ජනපදයේ බටුකච්චිය |
| 2. ඒ අබ්දුල්ලා, අංක 240, වාන්ඇල ... ... ... ... | එළ හරක් මස් ... | වාන්ඇල ජනපදයේ මුස්ලිම් කොටස |

12–155—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත**

**(261 වැනි අධිකාරය)**

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වැනි වගන්තිය යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ මහානාගපුර ගම් සභාවේ පාලන නිලධාරි විසින් ගෙනා ඇති පහත දැක්වෙන තීරණය එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරනු ලැබේ.

තීරණය

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වන දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වන දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද (අංක 1 සහ 37 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව),

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද,

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වාවූ කාණ්ඩද, (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුළුව),

1972 නොවැම්බර් මස 3 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූ අංක 42 දරණ කොටසේ සඳහන් පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවද මෙම තීරණය පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට අම්පාර දිස්ත්‍රික්කයේ මහානාගපුර ගම් සභාවේ පාලන නිලධාරි විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් තීරණය කරනු ලැබේ.

ඒ. පී. විජයරත්නම්,
පාලන නිලධාරි, මහානාගපුර ගම්සභාව.

1973 නොවැම්බර් මස 26 වන දින,
මහානාගපුර ගම්සභා කාර්යාලයේ දීය.

12–191—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපේ ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන අය, ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් ඇති ස්ථානවල මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, එසේ බලපත්‍ර නිකුත් කිරීම ගැන බෝපේ ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නෙහි නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කරමින් පිටපත් දෙකකින් යුත් ලිඛිවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වැනි පරිච්ඡේදය) අංක 7(2) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| බලපත්‍ර ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම සහ ස්ථානය |
|---|---|
| 1. ඒ. ජේ. ඇම්. රසාක්, කලාපිටිය පාර, ගාල්ල ... ... | හරක් මස් කඩයක්, කහදූවවත්ත හන්දියේ, කිරිඔවිට ඉඩම |
| 2. ඇම්. සී. ඒ. ස්වායිල්, කුරුඳුවත්ත, ගින්තොට ... ... | හරක් මස් කඩය හා එළුමස් කඩය, කුරුඳුවත්ත නො. 1 කැබැල්ල |
| 3. ඇම්. ටී. ඇම්. හාරිස්, 102/3, බෝපේ පාර, දඩල්ල, ගාල්ල ... ... | හරක් මස් කඩය හා එළුමස් කඩය, වැලිපිටිමෝදර අම්පිටිය වත්ත |

එච්.ඇල්. එච්. ජයසුන්දර,
බෝපේ ගම්සභාවේ සභාපති.

බෝපේ ගම්සභා කාර්යාලය,
කලේගාන,
ගාල්ල, 1973.11.26.

12–152—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

යටිනුවර මැද පලාත ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛණයේ නම සඳහන් අය ඊට ඉදිරියේ සඳහන් ස්ථානයෙහි 1974 වර්ෂය සඳහා එළහරක් මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍ර අයදුම් කොට ඇත. එම බලපත්‍ර නිකුත් කිරීම ගැන යටිනුවර මැද පලාත ගම් ප්‍රදේශය තුළ පදිංචි යම් කිසිවෙකු විරුද්ධ වනේ නම්, ඒ බව කරුණු සහිතව පිටපත් දෙකකින් යුත් ලිඛිත ප්‍රකාශනයකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට සති දෙකක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 අධිකාරියේ) 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|
| ඇම්. අයි. ඇම්. ඔලිඳු, තලාපිටිය, දෙහිඅංග, මුරුතලාව ... | දෙහිඅංග ගමේ අන්වර්දීන්ට අයිති හිරිපිටියේ වත්ත ... | එළහරක්මස් කඩය |

ජී. ලේන්සුවා,
සභාපති,
යටිනුවර මැද පලාත ගම්සභාව.

යටිනුවර මැද පලාත ගම්සභා කාර්යාලය,
ඇඹිල්මීගම, මුරුතලාව,
1973.11 23.

12–74—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ දොඩන්ගස්ලන්ද ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛණයේ සඳහන් අය විසින් 1974 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාමට බල පත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බල පත්‍ර නිකුත් කිරීමට දොඩන්ගස්ලන්ද ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස්මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ඩී. සාන්ත ජයවර්ධන,
දොඩන්ගස්ලන්ද ගම්සභා වේ පාලන නිලධාරි.

1973 නොවැම්බර් මස 27 දින,
ගම්සභා කාර්‍යාලය,
දොඩන්ගස්ලන්ද.

### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. පී. ඇල්. ස. ලිම්, තෙළඹුගල්ල—දොඩන්ගස්ලන්ද ... | ... එළහරක් මස් | ... තෙළඹුගල්ල |

12-236—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ නාරන්වල ප්‍රදේශයේ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛණයෙහි නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1974 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍ර ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත්කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ නාරන්වල ගම්ප්‍රදේශයේ ගම්සභා සීමාව තුළ පදිංචි යම්කෙනෙක් විරුද්ධවන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධවන්නේ කුමන කරුණු නිසාද යන වග සඳහන් ලි ්විල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහහතර "14" දිනක් ඇතුළත මා වෙත එවියයුතු බව මෙයින් බව මෙයින් ්න්ාමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | වෙළඳාම පවත්වන ස්ථානය |
|---|---|---|
| 1. ඇම්. ඩී. ඇම්. ආරිෆ්, වල්ගම–මල්වාන | ... | දෙල්ගොඩ පොදු වෙළඳපොල ගොඩනැගිල්ලේ අංක 7, දරණ කඩ කාමරය |
| 2. ඇම්. ඩී. ඇම්. ඇම්. ආරිෆ්, වල්ගම -මල්වාන | ... | මල්වානේ-වල්ගම පිහිටි රිෆායා ගොඩනැගිල්ලේ අංක 5, 6 සහ 7 දරණ කඩ කාමර |
| 3. ඇම්. ඩී. ඇම්. ආරිෆ්, වල්ගම–මල්වාන | ... | වල්ගම පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමේ සතුන් මරණ ස්ථානය |

එස්. කේ. සූරියආරච්චි,
නාරන්වල ගම්සභාවේ සභාපති තැන.

1973 නොවැම්බර් 21,
නාරන්වල ගම්සභාව, දෙල්ගොඩ.

12-15—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## කැකිරාව—දකුණු කලාගම් කෝරලේ ගම්සභාව—පොදු මංමාවත්

අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු කලාගම් කෝරලේ ගම්සභාව සීමාව තුල මහජනයා විසින් ප්‍රයෝජනයට මෙහි පහත උප ලේඛණයේ සඳහන් ගම්සභා පාරවල් සියල්ලම 257 අධිකාරයේ ගම්සභා ආඥාපනතේ 42 වගන්තිය යටතේ ගම්සභා පාරවල් වශයෙන් ප්‍රසිද්ධ කරණ බැව් මෙයින් නිවේදනය කරමි.

යෝජිත කරුණු පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව හෝ අදල ඉඩම් හිමියන් විසින් මෙයට විරුද්ධත්ත්වයක් දක්වන්නේ නම්, එසේ විරුද්ධවීමට ඇති හේතු දැක්වෙන ලිපියක් (පිටපත් 2 කින් යුතුව) මෙම දැන්වීම රජයේ ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුලත මාවෙත ඉදිරිපත් කළ යුතු බවත් එකී කාළය තුලදී යම් කිසි විරෝධයක් එලෙස ඉදිරිපත් නොවිනම් එකී උපලේඛණයේ සඳහන් පාරවල් කැකිරාව—දකුණු කලාගම් කෝරලේ ගම්සභාව සතු පොදු දේපල ලෙස පිළිගෙන කැකිරාව-දකුණු කලාගම් කෝරලේ ගම්සභාව විසින් සාද හෝ නැවත සාදගැනීමේ හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ ඈවින් වාගෙන යනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරමි.

ඩබ්ලිව්. එච්. මර්වින් ප්‍රනාන්දු,
පාලන නිළධාරි—දකුණු කලාගම් කෝරලේ ගම්සභාව.

1973.10.20 දින,
කැකිරාව–දකුණු කලාගම් කෝරලේගම්සභා කාර්යාලයේදිය

### උපලේඛනය

#### අංක 1—පුලියන්කුලම කොට්ඨාශය

| | පාරේ නම | දිග සැ. | දම්. | අඩි. | පලල අඩි |
|---|---|---|---|---|---|
| 01. | කලාවැව පාරේ සිට පුලියන්කුලම ගම හරහා විජිතපුර ගම්සීමාව දක්වා වැටී ඇති පාර | 1 | 13 | 00 | 22 |
| 02. | පුලියන්කුලම ගමේ වැව් බැම්මේ සිට වෙල අයින දිගේ යෝධ ඇල දක්වා වැටී ඇති පාර | 0 | 75 | 00 | 15 |
| 03. | පුලියන්කුලම ගමේ වැව් බැම්මේ සිට දුම්රිය පාර හරහා විමලධම්ම මාවත දක්වා පාර කොටස | 0 | 28 | 00 | 15 |
| 04. | පුලියන්කුලම සිට විමලධම්ම මාවත බෝගහ අක්කරේ දක්වා පාර | 1 | 37 | 00 | 33 |
| 05. | කලාවැව ප්‍රසිද්ධ පාරේ සිට දුම්රිය පාර හරහා යෝද ඇල දක්වා පාර | 0 | 17 | 33 | 25 |
| 06. | පුලියන්කුලම වැව් බැම්මේ සිට ගම මැදින් වෙල දක්වා වැටී ඇති පාර | 0 | 05 | 00 | 12 |
| 07. | දුම්රිය පාරේ සිට අමනන්කට්ටුව ගම මැදින් යෝද ඇල දක්වා වැටී ඇති පාර | 0 | 38 | 00 | 25 |

#### අංක 2—බෝගහඅක්කරේ කොට්ඨාශය

| | පාරේ නම | දිග සැ. | දම්. | අඩි. | පලල අඩි |
|---|---|---|---|---|---|
| 01. | රදගම සිට අළුත් අක්කරේ හරහා යෝද ඇල දක්වා වැටී ඇති පාර | 0 | 53 | 00 | 25 |
| 02. | රදගම සිට ඉහළ වැව් බැම්ම දිගේ කරුක්කන්කුලම පාර දක්වා පාර | 0 | 50 | 00 | 25 |
| 03. | පුගොල්ලාගම අළුත් ගංගොඩ සිට පරණ ගංගොඩ දක්වා වැටී ඇති පාර | 0 | 12 | 00 | 25 |
| 04. | යෝද ඇල සිට හිරිපිටියාගම වෙල දක්වා වැටී ඇති පාර | 0 | 15 | 00 | 15 |
| 05. | රදගම ප්‍රසිද්ධ පාරේ සිට පිං පාර දක්වා පාර | 1 | 20 | 00 | 33 |
| 06. | රදගම අළුත් අක්කරේ සිට යෝද ඇල දක්වා පාර | 0 | 12 | 00 | 12 |

| | පාරේ නම | දිග | | | පලල |
|---|---|---|---|---|---|
| | | සැ. | දු. | අඩි | අඩි |
| 09. | මහ ඇලගමුව ප්‍රසිද්ධ පාරේ සිට ටී. කපුරුහාමිගේ ඉඩම සහ ඩිංගිරි අප්පු වෙද මහතාගේ ඉඩම අතරින් අළුත් හංගොඩ හරහා උණගොල්ලෑව පාර දක්වා වැටී ඇති පාර | 0 | 40 | 00 | 25 |
| 10. | මහඇලගමුව පාසැල් පාරේ සිට ඩී. ඇම්. වන්නි හාමිගේ සහ එච්. ඇම්. ටිකිරි අප්පුගේ ඉඩම් අතරින් මහ ඇලගමුව වෙල දක්වා පාර | 0 | 05 | 00 | 12 |
| 11. | මහ ඇලගමුව ප්‍රසිද්ධ පාරේ සිට කේ. වී. තේවහාමි සහ ටී. බී. දිසානායක ගේ ඉඩම් අතරින් උණගොල්ලෑව දක්වා වැටී ඇති පාරේ ගම් සීමාව දක්වා පාර | 0 | 40 | 00 | 33 |
| 12. | මහ ඇලගමුව ප්‍රධාන මාර්ගයේ සිට ටී. ඇම්. රංහාමි සහ ඇස්. ජී. ඇම්. කපුරුහාමි යන අයගේ ඉඩම් අතරින් මහඇලගමුව වෙලට වැටී ඇති දෙවැට පාර | 0 | 03 | 00 | 12 |
| 13. | මහ ඇලගමුව ප්‍රධාන මාර්ගයේ සිට ඇම්. ටිකිරිබංඩාගේ සහ කේ. මුදලිහාමිගේ ඉඩම් දෙක අතරින් මහ ඇලගමුව වෙල දක්වා වැටුනු පාර | 0 | 03 | 00 | 12 |
| 14. | මහ ඇලගමුව රජයේ ප්‍රධාන මාර්ගයේ සිට ඩී. ඇම්. රංහාමි සහ කේ. මැණික්රාල යන අයගේ ඉඩම් දෙක අතරින් වැටී ඇති දෙවැට පාර | 0 | 18 | 00 | 25 |
| 15. | මහඇලගමුව ප්‍රධාන මාර්ගයේ සිට ආර්. කපුරුහාමි සහ ඩබ්ලිව්. මල්හාමි යන අයගේ ඉඩම් අතරින් බත්දිපුවැව හරහා අප්පුගම දක්වා වැටී ඇති දෙවැට පාර | 1 | 43 | 00 | 25 |
| 16. | අංක 09 පාරේ සිට ඩිංගිරි අප්පු හා කපුරු හාමිගේ ඉඩම් මැදින් හෝරාපොල දක්වා දෙවැට පාර | 0 | 40 | 00 | 15 |
| 17. | අංක 09 පාරේ සිට ගුණසේකර සහ කේ. කිරිබංඩාගේ ඉඩම් මැදින් හෝරාපොල දක්වා දෙවැට පාර | 0 | 15 | 00 | 15 |
| 18. | අංක 09 පාරේ සිට අප්පුහාමි සහ මුදලිහාමිගේ ඉඩම් මැදින් දෙවැට පාර | 0 | 10 | 00 | 15 |
| | **අංක 9—කොරසගල්ල කොට්ඨාශය** | | | | |
| 01. | කොරසගල්ල රජයේ ප්‍රසිද්ධ පාරේ සිට රුණුකන්ද හරහා මැදගම ගම්මායිම දක්වා වැටී ඇති පාර | 2 | 19 | 00 | 33 |
| 02. | කොරසගල්ල වැව් වානේ සිට මහඇලගමුව ගම් සීමාව අසලින් රුනුකන්ද විහාරය දක්වා වැටී ඇති පාර | 0 | 48 | 00 | 33 |
| 03. | කොරසගල්ල වැව් වානේ සිට කුඹුක්වැව ගම් මායිම දක්වා වැටුනු පාර | 0 | 55 | 00 | 33 |
| 04. | කොරසගල්ල පන්සල අසල සිට පිං කුඹුර දක්වා වැටී ඇති පාර | 0 | 47 | 00 | 25 |
| 05. | කොරසගල්ල පාසැලේ සිට පන්සල හරහා කොරසගල්ල මහ ගම මැදින් වැව් බැම්මට වැටී ඇති දෙවැට පාර | 0 | 12 | 00 | 12 |
| 06. | කොරසගල්ල වැව් වානේ සිට අන්දරවැව කොරසගල්ල වැව් මායිම දක්වා වැටී ඇති පාර | 0 | 30 | 00 | 15 |
| 07. | කොරසගල්ල පන්සල් ඉඩමේ සිට පුරාණ වෙල දක්වා වැටුනු පාර | 0 | 08 | 00 | 12 |
| 08. | කොරසගල්ල වැව් වානේ සිට කටුපිල ගාල පුරාණ වෙල දක්වා තිස්බම හරහා වැටී ඇති පාර | 0 | 30 | 00 | 25 |
| 09. | කොරසගල්ල වැව් බැම්මේ සිට වත්තේ ගම්මැද්දට වැටුනු පාර | 0 | 02 | 00 | 12 |
| 10. | කොරසගල්ල කායම්වල වත්තේ තිස්බඹපාරේ සිට මහ ඇලගමුව ගම් සීමාව දක්වා වැටී ඇති පාර | 0 | 25 | 00 | 25 |
| 11. | කොරසගල්ල පාසැල අසල සිට පාසැල් සීමාව දිගේ බතල හේන් අක්කර පන්තිය දක්වා වූ පාර | 0 | 03 | 00 | 12 |
| | **අංක 10—මහවැව කොට්ඨාශය** | | | | |
| 01. | කැකිරාව කුඹුක්වැව පාරේ සිට අලියාවැටුනුවැව ගම් මායිම දක්වා වැටුනු පාර | 0 | 39 | 00 | 25 |
| 02. | කුඹුක්වැව සිට මහවැව හරහා මැදගම දක්වා පාර | 2 | 42 | 00 | 33 |
| 03. | කුඹුක්වැව වැව් වානේ සිට කොරසගල්ල ගම් සීමාව දක්වා වැටුනු පාර | 0 | 10 | 00 | 33 |
| 04. | කුඹුක්වැව ගමේ සිට කුඩාවැව, නාවාගස්වැව හරහා රත්මල්ලෑව දක්වා පාර | 1 | 14 | 00 | 25 |
| 05. | මහවැව වැව් වානේ සිට රුණුකන්ද පන්සල දක්වා වැටුනු පාර | 0 | 60 | 00 | 33 |
| 06. | රුණුකන්ද පන්සල අසල සිට මැදගම ගම්සීමාව දක්වා වූ පාර | 0 | 59 | 00 | 33 |
| 07. | මහවැව ගමේ ලිඳ ලඟ සිට ඇල කන්ද දිගේ රත්මල්ලෑව වැව් වාන දක්වා වැටුනු පාර | 1 | 05 | 00 | 25 |
| 08. | කුඹුක්වැව මහවැව පාරේ සිට කුඹුක්වැව වෙල දක්වා වැටුනු පාර | 0 | 18 | 00 | 25 |
| 09. | කුඹුක්වැව පරණ ගංගොඩ සිට නාවාගස්වැව වෙල දක්වා පාර | 0 | 35 | 00 | 33 |
| 10. | මහවැව-කුඹුක්වැව පුරාණ වෙල පාරේ සිට ලිඳ දක්වා පාර | 0 | 05 | 00 | 20 |
| | **අංක 11—රත්මල්ලෑව කොට්ඨාශය** | | | | |
| 01. | නබඩවැව දෙමුන්නෑව පාරේ සිට කිරිමැටියාව ගම් සීමාව දක්වා වැටී ඇති පාර කොටස | 0 | 53 | 00 | 25 |
| 02. | මොරගස්වැව වැව් වානේ සිට සියඹලාගස්වැව ගම් සීමාව දක්වා වැටී ඇති පාර | 0 | 55 | 00 | 33 |
| 03. | රත්මල්ලෑව මොරගස්වැව පාරේ සිට රත්මල්ලෑව පන්සල දක්වා වූ පාර කොටස | 0 | 15 | 00 | 25 |
| 04. | නබඩවැව සිට අලියා වැටුනුවැව අලියාවැටුනුවැව ගම්සීමාව දක්වා වැටී ඇති පාර කොටස | 2 | 45 | 00 | 33 |
| 05. | දෙමුන්නෑව පාරේ සිට රත්මල්ලෑව ගම දක්වා පාර | 0 | 12 | 00 | 20 |
| 06. | රත්මල්ලෑව ගම වටේ වැටී ඇති දෙවැට පාර | 0 | 32 | 00 | 12 |
| | **අංක 12—මැදගම කොට්ඨාශය** | | | | |
| 01. | මහවැව ගම් සීමාවේ සිට මැදගම වෙල දක්වා වැටුනු පාර | 0 | 68 | 00 | 25 |
| 02. | මැදගම ගමේ සිට මොරගස්වැව ගම් සීමාව දක්වා වැටුනු පාර | 1 | 14 | 00 | 33 |
| 03. | මැදගම ගමේ සිට මහ ඇලගමුව කඳුබිඩපාර දක්වා පාර | 0 | 21 | 00 | 25 |
| 04. | මැදගම පුරාණ වෙලේ සිට උඩ හිඟුර ගම් සීමාව දක්වා වැටුනු පාර | 0 | 66 | 00 | 33 |
| 05. | උඩහිඟුර ගමේ සිට මහඇලගමුව ගම් සීමාව දක්වා වැටුනු පාර | 0 | 53 | 00 | 25 |
| 06. | රුණුකන්ද මැදගම පාරේ සිට මැදගම පාසැල අසලින් මහවැව මැදගම පාරට වැටී ඇති දෙවැට පාර | 0 | 15 | 00 | 15 |
| 07. | උඩහිඟුර වැව් වානේ සිට මැදගම වම්බටුවැව වැව් වානේ දක්වා වැටුනු පාර | 0 | 60 | 00 | 33 |
| 08. | පල්ලේ හිඟුර ගම් මායිමේ සිට උඩ හිඟුර අළුත්වැව දක්වා වැටී ඇති පාර | 1 | 10 | 00 | 33 |

12—21—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ **ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාදා පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගනුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන් කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | | පිටරට | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදි, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 60 | ... | 0 | 15 |

**දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් | 73.12.07 | සිකුරාද ... | 73.11.30 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.14 | සිකුරාද ... | 73.12.07 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.21 | සිකුරාද ... | 73.12.14 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.28 | සිකුරාද ... | 73.12.21 | සිකුරාද | දහවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 අගෝස්තු මස 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.